


# සරසවියෙන් නිසි පල ගනිමු

**ධනපාල විජේසිංහ**

ISBN 978-955-43489-3-6

Rs. 200/=

# සරසවියෙන් නිසි පල ගනිමු



**ධනපාල විජේසිංහ**

# සරසවියෙන් නිසි පල ගනිමු

ධනපාල විජේසිංහ

සරසවියෙන් නිසි පල ගනිමු

සරසවි ප්‍රකාශය 2008
ප්‍රථම මුද්‍රණය 2017

© ධනපාල විජේසිංහ
ISBN 978 – 955 – 43489 – 3 - 6

කර්තෘ ප්‍රකාශනය
ධනපාල විජේසිංහ
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය



කර්තෘගේ වෙනත් කෘති

## *Other books published by the author in English language*

1. *A social theory of the Buddhist Five Precepts (First and second editions)*
2. ***Crime, Society and Culture in Sri Lanka***
3. ***Crime and Society in Sri Lanka***
4. ***Crime and People***
5. ***Religion and Society in Sri Lanka***
6. ***Social Change and crime in Sri Lanka (1935-1995) Vol.1***
7. ***Social Change and crime in Sri Lanka (1935-1995) Vol.2***

## *Books published in Sinhalese language*

1. ගුණදම් මිහිර
2. ධම්ම පදය - හෙළ කවි බසින්
3. ඉසිඹු ලැබුව ද සක්සමිදේ
4. උන්මාදවාහිනී කථා වස්තුව
5. ගුණදම්මිහිර-විස්තෘත දෙවනමුද්‍රණය
6. නෙළුම් පොකුණ

ශාස්ත්‍රීය ග්‍රන්ථ

7. සමාජාභිවර්ධන කාර්ය ප්‍රවේශය
8. සමාජ සුභසාධනය හා වෘත්තීය සමාජ සේවය
9. මාර්ග ප්‍රවාහනය හා සමාජය
10. ඉංග්‍රීසි භාෂාව හැදෑරීමට උපදෙස්
11. සභාචාරය
12. ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික සංස්කෘතිය කොයිබට ද
13. සරසවියෙන් නිසි පල ගනිමු
14. රූපවාහිනියේ කෘත්‍යාත්මක වැදගත්කම හා සංස්කෘතික ලක්ෂණ
15. ඉංග්‍රීසි භාෂා කුසලතාව
16. ස්වාධීන පර්යේෂණ නිබන්ධය සම්පාදනය කිරීමේ මාර්ගෝපදේශ
17. පංච ශීලයෙන් ප්‍රකට වන සමාජ න්‍යාය
18. අපරාධ නිවාරණ ප්‍රවේශය
19. මානව විද්‍යාව
20. ව්‍යවහාරික අපරාධ විද්‍යා ප්‍රවේශය
21. ශ්‍රී ලංකාවේ අපරාධ ***(1950-1987)*** 1
22. ශ්‍රී ලංකාවේ අපරාධ ***(1950-1987)*** 2



## පෙරවදන

"සරසවියෙන් නිසි පල ගනිමු" යන මෙම ප්‍රකාශනය වෘත්තිය මාර්ගෝපදේශ සංග්‍රහයෙහි එන දෙවන කෘතියයි. පළමු කෘතිය "ඉංග්‍රීසි භාෂාව හැදෑරීමට උපදෙස්" යනුවෙන් පළ විය. මහත් පරිශ්‍රමයක් දරා සරසවියට පැමිණියත් ඉන් නිසි ප්‍රයෝජනයක් ගන්නා සංඛ්‍යාව පිළිබඳව සෑහීමකට පත්විය නොහැකිය. එහිලා සිසුන් අභිප්‍රේරණය කිරීමට මෙම ලිපියෙන් අපේක්ෂා කෙරේ. අනාගත වෘත්තිය ජීවිතය පමණක් නොව අනෙකුත් කටයුතුවල සාර්ථකත්වය සඳහා සරසවියෙන් උපරිම ප්‍රයෝජනයක් ලබා ගැනීම ආධාර වන්නේය. නිසි ප්‍රයෝජන ගත් අය ප්‍රමාදයකින් තොරව රැකියාවලට යන අතර උපාධිය අවම මට්ටමෙන් සමත් කළ අය ලත වෙති. අපට අවශ්‍ය වන්නේ සියලු දෙනාම පූර්ණ මිනිසුන් වීමය.

සියලු දෙනාටම මෙයින් ප්‍රයෝජනයක් වනු ඇතැයි විශ්වාස කරමි.

ධනපාල විජේසිංහ
අධ්‍යක්ෂ
වෘත්තිය මාර්ගෝපදේශ අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය
2008.2.10

Prof. Dhanapala Wijeshinghe
Professor of Criminology and Criminal Justice
Department of Criminology and Criminal Justice
Faculty of Humanities and Social Sciences
University of Sri Jayewardenepura
Nugegoda, Sri Lanka.

# පටුන

හැඳින්වීම

පිටු අංක


| | | |
|---|---|---|
| 01. | සරසවියෙන් නිසි පල ගනිමු | 01 |
| 02. | දේශනවලට සහභාගිවීම | 20 |
| 03. | දේශනවලට අදාළ විෂය ඥානය දියුණු කිරීම | 21 |
| 04. | වෙනත් ක්ෂේත්‍රවලට අදාළ කියවීම | 22 |
| 05. | පුස්තකාලයේ පවත්නා සඟරා කියවීම | 23 |
| 06. | පුස්තකාලයේ පවත්නා පුවත්පත් කියවීම | 24 |
| 07. | විදේශ පුවත් කියවීම | 25 |
| 08. | ඉංග්‍රීසි භාෂාව වර්ධනයකර ගැනීම | 27 |
| 09. | පරිගණක තාක්ෂණ දැනුම දියුණු කිරීම | 31 |
| 10. | අන්තර්ජලය පරිශීලනය කිරීම | 32 |
| 11. | සම්මන්ත්‍රණ, සංවාද ආදියට සහභාගි වීම | 32 |

| | | |
|---|---|---|
| 12. | කලාත්මක, සෞන්දර්යාත්මක වින්දනය | 33 |
| 13. | ක්‍රීඩාවක නිරත වීම | 35 |
| 14. | සරසවි ශිෂ්‍යාභිමානය | 37 |
| 15. | සරසවියේ විවිධ අංශවලින් ප්‍රයෝජන ගැනීම | 39 |
| 16. | විශ්ව විද්‍යාලය පිළිබඳ දැනුම | 40 |
| 17. | ගුරු ශිෂ්‍ය සබඳතා | 42 |
| 18. | විෂය නාම පිළිබඳ දැනුම | 44 |
| 19. | සරසවි පරිපාලනය පිළිබඳ දැනුම | 45 |
| 20. | සරසවි සාමය | 48 |
| 21. | අපිරිසිදුකම හා අලංකාරය | 53 |
| 22. | අලාභ නොකිරීම | 54 |
| 23. | ස්වභාෂාව හා සන්නිවේදන කුසලතාව | 55 |
| 24. | කියවීමට ලිපි සංග්‍රහයක් | 61 |
| 25. | කර්තෘගේ ශාස්ත්‍රීය ලිපි | 63 |




# 1

# සරසවියෙන් නිසි පල ගනිමු

දින මු දින මු ඉටු සිත කුළු ගැනුමින්
නව මු නව මු නැණ ගුණ නිති වඩමින්
නෙළ මු නෙළ මු නිසි ඵල සරසවියෙන්
නග මු නග මු ලක්මව සිරි සැපතින්

ඔබ සරසවියට ප්‍රවේශ වන්නේ නැවුම් බලාපොරොත්තු රාශියක් සිතෙහි තබා ගෙනය. ඔබ පමණක් නොව ඔබේ දෙමව්පියන් තුළ ද භාරකාරයන් තුළ ද සහෝදර සහෝදරියන් හා සමීපත ම ඥාතීන් තුළ ද ඔබ පිළිබඳ විශාල බලාපොරොත්තුක් තිබේ. ඒ උසස් අධ්‍යාපනය ඉතා සාර්ථක ව නිම කිරීම හා උසස් තත්ත්වයකට පත් වීම අවසාන ඉලක්කය කොටගත් බලාපොරොත්තුවකි. ඔබේත් ඔබගේ ඥාතීන්ගේත් මේ බලාපොරොත්තු සප්‍රමාණ ලෙස සාර්ථක වීම සඳහා මේ උපදෙස් හා ඔවදන් මෙසේ ඉදිරිපත් කිරීමට අදහස් කරමි.

සරසවියට පැමිණි විගස ඔබ මහත් අමන්දානන්දයට පත් වූවාට සැකයක් නැත්තේය

මහත් පරිශ්‍රමයකින් උසස් පෙළ අධ්‍යාපනය නිම කළ දහස් සංඛ්‍යාත ශිෂ්‍ය ප්‍රජාව අතරින් ඔබට ලැබී ඇත්තේ වාසනාව පෙරදැරි කර ගත් අවස්ථාවකි. වසරකට දෙලක්ෂ පනස්දහසක් පමණ උසස් පෙළට පෙනී සිටිය ද සරසවියට වරම් ලබනුයේ විසිදාහසකට ආසන්න සංඛ්‍යාවකි. එම සංඛ්‍යාව ද එසේ වැඩි වූයේ මෑත වර්ෂයේය. ඔබ මෙම ජයග්‍රහණය තරයේ සිතට ගැනීම මෙහිදී අවධාරණය කළ යුතු ප්‍රථම කරුණය. කවර පීඨයකට තේරී ආව ද ඔබට ලැබී ඇති මේ අවස්ථාව අනගි අවස්ථාවකි. එය අනගි වන්නේ නිදහස් අධ්‍යාපනය ලැබීමට ලැබෙන වරමක් බැවිනි. සරසවියට ප්‍රවේශ වී උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව ලබන සුළු පිරිස අතරට එක්වීමට අවස්ථාව ලැබීම කොතරම් වටිනා අවස්ථාවක් ද යන්න අමුතුවෙන් කිව යුතු නොවේ.

මෙම අවස්ථාව නිදහස් අධ්‍යාපනයත් සමග තේරුම් ගත යුතුය. අපේ රටේ අධ්‍යාපනය හෝඩියේ සිට සරසවිය දක්වා නොමිලයේ ලැබීම නිසා බොහෝ දෙනෙකුට එහි වටිනාකම නොදැනේ. දැනුණත් ගණන් නොගෙන සිටිති. පාසල් අධ්‍යාපනය නොමිලේ ලැබීම හැරෙන විට උසස් අධ්‍යාපනයත් නොමිලේ ලැබීම ගැන බොහෝ රටවල ජනයා පුදුම වෙති. තම දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන් කොරියාව, ජපානය ආදී රටවල ජනයා විශාල වශයෙන් වියදම් කරති. ඒ වියදම් අතර උසස් අධ්‍යාපන වියදම ඉතා අධිකය. උසස් අධ්‍යාපනය අපේ රටේ මෙන් නොමිලයේ නොලැබෙන බැවිනි. එම රටවල සමහරෙක් බැංකු ණය ගෙන දරුවන්ට උගන්වති. පවුලක එක් අයෙක් හෝ දෙදෙනෙක් විශ්ව විද්‍යාලයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක



ඉගෙනීමට හෝ පුහුණුවකට යොමු වීම මහත් ආර්ථික බරකි. එය පවුලට බරපතල ලෙස දැනෙන බව ඔවුහු ප්‍රකාශ කරති. එවැනි පසුබිමක් තුළ ඔවු හු අපේ රටේ නිදහස් උසස් අධ්‍යාපනය ගැන පුදුම වෙති.

උසස් අධ්‍යාපනය නොමිලයේ ලබා දෙනවාට අමතරව ආර්ථික ආධාර වශයෙන් ශිෂ්‍යාධාර හෝ ශිෂ්‍යත්ව මුලදක් ද සියලු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ලබා දීම පිළිබඳව අසා එම රටවල උගත් දෙමව්පියෝ පුදුමයෙනුත් පුදුමයට පත් වෙති. අධ්‍යාපනයට මෙතරම් සුභසාධනයක් පවත්නා රටක් තමන් නොදන්නා බව ප්‍රකාශ කරති. එසේම අපේ රටේ අධ්‍යාපනය ගැන අප කියන දේ සත්‍යයක් ද යන්න තහවුරු කර ගැනීමට තවත් කීප දෙනෙකුගෙන් හෝ අසා බලන බව ද පෙනිණි. ඊට හේතුව වර්තමාන ලෝක තත්ත්වයකට සාපේක්ෂව මෙතරම් නිදහස් අධ්‍යාපනයක් හා අධ්‍යාපන සුභසාධනයක් රටක පැවතීම පුදුමයට කරුණක් වීමය. එය සැබැවින්ම යථාර්ථයක් බව පසක් වූ කල ඔවුහු අප රටේ තරුණ තරුණියන්ගේ මේ භාග්‍යය ගැන සතුටු වෙති. එවැනි සහනයක් පැවතීම පවුලකට ද මහත් භාග්‍යක් බව ඔවහු තවදුරටත් ප්‍රකාශ කළහ.

මා මේ අත්දැකීම සඳහන් කළේ අපේ නිදහස් අධ්‍යාපනයේ හා අධ්‍යාපන සුභසාධනයේ වටිනාකම ලෝකයට සාපේක්ෂව අපේ නවක සිසුන්ට පෙන්වා දීමටය. මෙරට තුළම සිටින විට මෙරට ඇතැම් දේවල වටිනාකම නොතේරෙන්නේය. පිටරට හොඳය, අපේ රට නරකය, වැනි ආකල්ප බොහෝ දෙනෙකු තුළ පවතී. ඇතැම් දෑ සම්බන්ධයෙන් එය සත්‍ය විය හැකිය. එහෙත් නිදහස් අධ්‍යාපනයේ දී හා අධ්‍යාපන සුභ සාධනයේදී මෙරට තරම් හොඳ රටක් තවත්

නැත්තේය. මෙතරම් අවම පිරිවැයකින් ගුණාත්මක භාවයෙන් උසස් අධ්‍යාපනයක් ලැබිය හැකි රටක් නැත්තේය. ඇතැම් රටවලින් ඉතා උසස් මට්ටමේ ගුණාත්මක වටිනාකමක් ඇති උසස් අධ්‍යාපනයක් ලැබිය හැකිය. එහෙත් ඒ සඳහා විශාල පිරිවැයක් ද දැරිය යුතුය. එහිදී එම වරප්‍රසාදය ආර්ථික හැකියාව මත රඳා පවතින්නේය. මෙරට ජනයාට පංති පරතරයකින් බලපෑම නොලබා උසස් අධ්‍යාපනය සුලභව පැවතීම අප කවුරුත් ගැඹුරින් තේරුම් ගත යුත්තකි.

මෙතරම් අනගි අවස්ථාවක් ලැබී ඇත්තේ රාජ්‍ය අංශයේ කැපවීම මතය. රජය වාර්ෂිකව මෙරට අධ්‍යාපනය වෙනුවෙන් විශාල ධනස්කන්ධයක් වැය කරන්නේය. ඒ ධනය අනාගත ආයෝජනයක් වන්නට නම් එයින් ශිෂ්‍ය ශිෂ්‍යාවන් නිසි ප්‍රයෝජන ගත යුතුය. එහෙත් කොතෙක් දුරට නිසි ප්‍රයෝජන ගන්නේ ද යන්න ප්‍රශ්නයකි. සරසවි ශිෂ්‍යයා මේ ජාතික වගකීම තේරුම් ගත යුතුය. ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයකට එන ශිෂ්‍යයාට ස්වාභිමතය අනුව උසස් අධ්‍යාපනය ලැබිය හැකි වන අතර එම අවස්ථාව සමග සෙල්ලම් කිරීමට නොහැකිය. එම අවස්ථාව ආවාට ගියාට භාර ගත නොහැකිය. මන්දයත් ජාතික ධනයෙන් විශාල ප්‍රතිශතයක් ඔවුන් වෙනුවෙන් කැප කරන බැවිනි. විශාල ධනස්කන්ධයක් යොදවා විශ්වවිද්‍යාල පවත්වාගෙන යනු ලබන්නේ සිසුන්ගේ අභිවෘද්ධිය තුළින් ජාතිය ගොඩ නැගීම සඳහාය. එබැවින් සරසවි වරම වූ කලී ජාතික වගකීමකින් යුක්තව භාරගත යුත්තකි. වටහා ගත යුත්තකි. සරසවිය හුදු උද්‍යානයක් නොවන්නේය. එය ශාස්ත්‍රීය කේන්ද්‍රස්ථානයකි, කලාගාරයකි, සාහිත්‍ය මණ්ඩපයකි, සාමූහිකත්වයේ



කේන්ද්‍රස්ථානයකි. විවිධ ජනවර්ගයන්ගේ සමාජානුකලනය හා වාර්ගික හා ආගමික සංහිඳියාව ගොඩනගන ස්ථානයකි. අවසාන වශයෙන් ගුණගරුක විද්‍යාර්ථීන්ගේ ජන්ම භූමිය ය. එම භූමියට ප්‍රවේශ වන්නා එහි වටිනාකම, ගෞරවය, අභිමානය තේරුම් ගත යුතුය. ඊට සරිලන්නෙක්, ගැළපෙන්නෙක්, එහි කීර්තිය උද්දීපනය කරන්නෙක් විය යුතුය. ඊට හෘදයාංගම ලැදියාවක් ඇත්තෙක් විය යුතුය.

සරසවියට ප්‍රවේශ වන නවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් උසස් අධ්‍යාපනයේ අග්‍රඵල නෙළා ගැනීමේ අභිප්‍රේරණයකින් යුක්ත විය යුතුය. මෙම අභිප්‍රේරණය විශ්වවිද්‍යාලයට එනවිට පැවතුනත් එහි කලක් සිටින විට ක්ෂය වන බවක් ඇතැම් සිසුන් තුළින් දෘශ්‍යමාන වන්නේය. එනම් විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වීමට තිබූ උනන්දුව එහි සම්පත්වලින් ප්‍රයෝජන ගැනීමට නොතිබීමය. එසේ නැත්නම් උනන්දුව අඩු වී යෑමය. ඇතැම් සිසුන් ඉතා උද්යෝගයෙන් ඉගෙන ගන්නා අතර, ඇතැම් සිසුන් එසේ මන්දෝත්සාහී වන්නේ මන්ද යන්න තේරුම් ගත යුතු ප්‍රශ්නයකි එමගින් පිළියම් යෙදිය යුතුය.

සරසවියට පැමිණීමේ ප්‍රීතියත් එයින් නැගුණු අභිප්‍රේරණයත් "පුදන කොටම කාපි යකා" කීවාක් මෙන් නැතිකර දමනු ලබන අවස්ථාවකි, මුල් කාලයේ දී ම පවත්නා නවක වධය හා එහි දී අසන්නට ලැබෙන ඇතැම් ගැටලු හා අදෝනාවන්. විවිධාකාරයෙන් පවත්නා නවක වධය ඇතැම් සිසුන්ට ඔරොත්තු දිය හැකි වුවත් ඇතැම් සිසුන්ට සරසවිය හා ශිෂ්‍ය ප්‍රජාව කලකිරවන්නකි. එම නවක වධ අත්දැකීම් විසින් උසස් බලාපොරොත්තු හා ඒ සඳහා වූ යහපත් අභිප්‍රේරණය බිඳ දමනු ලැබේ. ප්‍රවේශයේ දී ම එසේ

බලාපොරොත්තු බිඳ දැමීම අභාග්‍ය සම්පන්න තත්ත්වයකි.

වඩාත් ම අසුභ ලක්ෂණයක් වන්නේ විවිධ අඩුපාඩු හා ඒ පිළිබඳ අඳෝනා මගින් නවක සිසුන් කලකිරවීම ය. දේශපාලන හා විවිධ අරමුණු සහිතව පවත්වනු ලබන රැස්වීම් ආදිය මගින් ද, කණ්ඩායම් හමු මගින් ද ඇතැම් ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයෝ විවිධ අඩුපාඩු ගැන නවක සිසුන්ට කරුණු කියති. මෙකී අඩුපාඩු ඉදිරිපත් කිරීම තුළින් ඔවුහු සරසවිය විවේචනය කරති. විශ්වවිද්‍යාල ප්‍රධානියාගේ පටන් අධ්‍යයන අනධ්‍යයන කාර්ය මණ්ඩල මේ විවේචනවල ඉලක්ක වෙති. අසවල් අසවල් දේ නැති බවත් ඒවා දිනා ගැනීමට උත්සාහ කළ යුතු බවත් ඒ සඳහා පෙළ ගැසිය යුතු බවත් කියති. නවකයා ඉදිරියේ මෙසේ අඩුපාඩු රාශියක් ඉදිරිපත් කිරීමෙන් ඔහුගේ සුන්දර බලාපොරොත්තු සහිත සිහින ලෝකය බිඳ දැමේ. නිතර නිතර "නැති බණේ" හා අඳෝනාවන් අසන්නට ලැබීමෙන් නවක ශිෂ්‍ය සිත කර්කශ කෙරේ. මෙය අසුභ ක්‍රියාවක් වන්නේය.

විවිධ අඩුපාඩු තිබීම සැබැවක් වුවත් ඒ සියල්ල නවක සිසුන්ගේ කලකිරීමට හේතුවන පරදි සරසවියට එනවිටම ඉදිරිපත් කිරීම යෝග්‍ය නොවන්නේය. අලුතෙන් විවාහ වූ යුවලට ඊලඟ දිනයේ සිට මුහුණ දීමට සිදුවන ගැටලු ගැනම අඳෝනාවක් ඉදිරිපත් කොට විවාහයේ සුන්දරත්වය හා අපේක්ෂාවන් හංග කරන්නා සේ නවකයාගේ අපේක්ෂාවන් ද විශ්වවිද්‍යාලයට පැමිණීමේ ප්‍රීතිය ද හංග නොකළ යුතුය. එය වැරදි ආරම්භයකි.



නවක සිසුන්ගේ පැත්තෙන් බලා ඔවුන් විශ්වවිද්‍යාලයෙන් ඉහළම ප්‍රයෝජනය ලබා ගන්නා පරිදි විශ්ව විද්‍යාලය හඳුන්වා දිය යුතුය. එසේ හඳුන්වා දීමක් සමාරම්භක උත්සවයේ දී කෙරෙන කථාවලින් සිදුවන්නේය. සමාරම්භක උත්සවයේදී විශ්ව විද්‍යාලයේ උපකුලපතිතුමා, පීඨාධිපතිවරු ආචාර්යවරු හා වෙනත් බලධාරීහු කතා කරති. ඒ කවුරුත් සරසවිය හඳුන්වා දීමටත් එයින් උපරිම ප්‍රයෝජනය ගැනීමටත් ක්‍රියා කිරීමේ වැදගත්කම පෙන්වා දෙති. එසේ ලබන අවබෝධය නැති වී යන්නේ විවේචන බහුල කතා සහෝදර සිසුන්ගෙන් අසන්නට ලැබීමත් සමඟය. සමහර අවස්ථාවල ඍජුවම පරස්පර විරෝධී අදහස් ඉදිරිපත් කොට සමාරම්භක අවස්ථාවේදී ඉදිරිපත් කෙරුණු කරුණු නිශේධ කරති.

අපේ සංස්කෘතිය ඇති දේ නොකීමටත් නැති දේ ගැනම කීමටත් විවේචනය කිරීමටත් බර වූවකි. ඒ නිසා පවත්නා සම්පත්වලින් සතුටු වනවාට වඩා නොපවත්නා දෙයක් ගැන නිතර අඳෝනා නගමින්, දුක්වෙමින් පවතින දෙයින් ලැබිය යුතු සැපයවත් නොලබති. පවතින දෙය අගය නොකරති. මේ ලක්ෂණය සරසවියේ ද සිසුන් අතර පවති. විශ්වවිද්‍යාලයේ දැනට සුලභව පවත්නා සම්පත් ඔවුන්ට නොපෙනේ. ඒවා දැක සතුටු වෙනවා වෙනුවට නැති දෙයක් ගැන කියමින් නවක සිසුන්ගේ බලාපොරොත්තු කඩ කරති. විශ්ව විද්‍යාලයේ කොතෙක් අඩු පාඩු තිබුණ ද එය අතීතයට සාපේක්ෂව උසස් තත්ත්වයකට පැමිණ තිබේ. දියුණු වී තිබේ. දැනට පවත්නා සම්පත් මීට දශකයකට කලින් නොපැවතිණි. එකල පැවති සම්පත් ද කලින් දශකයේ

නොපැවති ඒවාය. දිගින් දිගටම සරසවිය දියුණු වෙමින් පවතින අතර බොහෝ අංශ ඉදිරියේ දී දියුණු වනු ඇත. නවක ශිෂ්‍යයා මේ සම්පත් දැක සතුටු විය යුතු අතර එයින් තව තවත් අභිප්‍රේරණය විය යුතුය. උසස් අධ්‍යාපනය වඩාත් හොඳින් ග්‍රහණය කර ගැනීමේ අභිලාෂය දියුණු තියුණු විය යුතුය. පැමිණි විටම අඥෝනාවන් ඉදිරිපත් නොකරන්නැයි අප ඉල්ලා සිටිනුයේ එයින් ඵලක් නොවන බැවිනි. අප කවුරුත් ඉදිරිපත් කළ යුත්තේ සුලභ සම්පත්වල ප්‍රයෝජනය හා ප්‍රයෝජනයට ගන්නා ආකාරය ය.

නවකයන් මහා සරසවියක් තුළ කල්පනාවෙන් කටයුතු කළ යුතු වන්නේ විවිධ ශිෂ්‍ය ක්‍රියාකාරකම් මගින් උසස් උධ්‍යාපනයට වඩා වෙනත් දේවල්වලට යොමු වීමට ඉඩ තිබෙන බැවිනි. විශේෂයෙන් ම දේශපාලනය ප්‍රාථමික වී අධ්‍යාපනය ද්විතීයික වුවහොත් විශ්වවිද්‍යාලයෙන් නිසිඵල ලබා ගැනීමට කාලයක් නොලැබෙන්නේය. සිසුන් දේශපාලනය නොකළ යුතු බවක් මෙයින් අදහස් නොවේ. අනාගත නායකත්වය සඳහා පුද්ගලයන් සූදානම් විය යුත්තේ සරසවියේදී ය. එවැනි නායකත්වයක් වර්ධනය වන ආකාරයේ දේශපාලනයක යෙදීමේ වරදක් නැත. ප්‍රජාතන්ත්‍රවාදී රටක පවත්නා නිදහස කාටත් පොදුය. උසස් අධ්‍යාපන සුදුසුකම් සහිත නායකත්වය වඩාත් වැදගත්වන බැවින් අධ්‍යාපනය ප්‍රාථමික විය යුතුමය. අධ්‍යාපනයට මුල් තැන දිය යුතුමය. අනෙක් සියල්ල දෙවන තැනට හෝ තෙවන තැනට පත් කර ගැනීමෙන් විශ්ව විද්‍යාලයෙන් උපරිම ප්‍රයෝජන ලැබෙන්නේය. සරසවියේ සිටින කාලය සීමා සහිත බැවින් එම කාලය අධ්‍යාපනය වෙනුවෙන් මිඩංගු වන



පරිදි කළමනාකරණය කර නොගත හොත් අනාගතයේදී දුක් වීමට සිදුවන්නේය.

සරසවියෙන් නිසිඵල ලබා නොගැනීමට හේතු වී ඇති කරුණකි, ඌන කැපවීම. කැපවීම වූ කලී යම් අරමුණක් ජයග්‍රහණය කිරීම සඳහා අවශ්‍යම ගුණාංගයකි. කැප වන්නේ යම් ප්‍රමාණයකට ද ජයග්‍රහණය ද එම ප්‍රමාණයට ලැබෙන්නේය. ඇතැම් පීඨවල සිසුහු ඉතා හොඳ කැපවීමකින් අධ්‍යයනයේ යෙදිති. ඇතැමෙක් එසේ නොයෙදෙති. ඔවුන් තුළ උසස් ප්‍රතිඵල ලබා ගැනීමේ අභිප්‍රේරණයකට වඩා කෙසේ හෝ උපාධිය සමත් කිරීම ප්‍රමාණවත් ය යන හැඟීමක් පවතී. මෙය අසුභ ලක්ෂණයක් වන්නේය. කවුරුත් අභිප්‍රේරණය විය යුත්තේ ගුණාත්මක භාවයෙන් යුත් උසස් සුදුසුකමක් ලබා ගැනීමටය.

කැප නොවීම නිසා කාලය අපතේ යන අතර තමා ද, රජය ද වියදම් කළ අති විශාල ධනස්කන්ධයේ නිසි ඵල නොලැබෙන්නේය. එසේම නුසුදුසු පෞරුෂ ගුණාංගයක් ද වර්ධනය වන්නේය. එනම් මහන්සියකින් තොරව අවමයෙන් අවශ්‍යතා සපුරා ගැනීම පිළිබඳ පෞරුෂ ලක්ෂණයකි. එවැනි පෞරුෂ ලක්ෂණ අනාගත නායකත්වයට නොගැළපෙන්නා සේම පුද්ගල දියුණුවට ද රටේ දියුණුවට ද බාධාවකි. රටක් දියුණු වන්නේ කැපවීමෙන් කටයුතුකොට උපරිම මට්ටමෙන් ප්‍රතිලාභ ලැබීමෙන් ය. සරසවියේදී සිසුන් දියුණු කරගත යුත්තේ අසීමිත ලෙස කැපවී කටයුතු කිරීමේ ගුණාංගය මිස තැන තැන හරසුන් මාතෘකා කතා කරමින් කාලය කා දමන පෞරුෂ ගුණාංග නොවන්නේය. සරසවිය සෑම පැයක්ම ගෙවා දමන්නේ විශාල මූල්‍ය පිරිවැයක් සහිතව බවද මෙහිදී අමතක නොකළ යුතුය. සරසවියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්

එයින් ප්‍රයෝජන නොගෙන කාලය කා දමන්නේ නම් ඉහත පිරිවැය දරෙන්නේ නිරපරාදේය. ඵල රහිතවය. මේ කරුණ සිසුන් තරයේ සිතට ගත යුතුය.

මෙහිදී ප්‍රශ්නය වන්නේ ඉගැන්වීම සිදු වුවත් ඉගෙන ගැනීම කොතෙක් දුරට සිදුවනනේ ද යන්නයි. එනම් සිසුන් විසින් ස්වයං අධ්‍යයනය කොතෙක් දුරට සිදුකරන්නේ ද යන ප්‍රශ්නයය. සිසුන් දේශනවලට පමණක් සීමා වන්නේ නම්, පාසලත් සරසවියත් අතර වෙනසක් නැත්තේය. ගුරුවරයා උගන්වන දේට සීමා වීමෙන් විශ්වවිද්‍යාලය තවත් පාසලක් බවට පරිවර්තනය කිරීමක් සිදුවන්නේය. විශ්වවිද්‍යාලය සැබෑම උසස් අධ්‍යාපන ආයතනයක් වීමට නම් සිසුන්ගේ ඉගෙනීම ඉගැන්වීම අභිබවා යා යුතුය. එනම් ගුරුවරු පවත්වන දේශන අභිබවා සිසුන් විසින් කරුණු හැදෑරිය යුතුය. ස්වයං අධ්‍යයනයෙහි යෙදිය යුතුය. එය අධ්‍යාපනයේ ප්‍රධාන ලක්ෂණය බවට තද ආකල්පයක් කවුරුත් දැරිය යුතු අතර එයින් අභිප්‍රේරණය වී ක්‍රියා කළ යුතුය.

එහෙත් සැබෑ තත්ත්වය ඛේද ජනකය. අද සරසවිවල ඇතැම් සිසුන් සරසවියට එන්නේ සතියකට දින දෙක තුනකි. පැමිණෙන දවසක වුවත් සරසවියේ රැඳෙනුයේ පැය කීපයකි. නේවාසිකාගාරවල සිටින සිසුන් වුවද සරසවියේ අධ්‍යාපන කටයුතුවල නිරත වනුයේ සතියේ දින කීපයක සීමිත කාලයකි. විශ්වවිද්‍යාලයට නොඑන්නේ මන්දැයි කියා ඔවුන්ගෙන් විමසූ විට ලැබෙන පිළිතුර වන්නේ දේශන නොමැති නිසා නොපැමිණෙන බවය. සමහරෙක් එක් දේශනයක් පමණක් තිබෙන දවසට ද නොඑති. එය අනවශ්‍ය වියදමක් ලෙස සලකා පැමිණි අයෙකුගෙන් අදාළ දේශන පිටපතක් ලබා ගනිති. සමහරෙක්



දේශනයට සහභාගි වීම පමණක් අධ්‍යාපනය ලෙස සලකා සෙසු පාඨමාලාවන්වල විවිධ අධ්‍යාපනික නොවන කටයුතුවල යෙදෙති. එසේ නැතිනම් නිකරුණේ කාලය ගත කරති. මේ ශිෂ්‍ය චර්යාවෙන් පිළිබිඹු වන්නේ කුමක් ද යන්න තේරුම් ගැනීම අපහසු නොවන්නේය.

දේශනවලට පමණක් එන්නේ නම් සැබැවින්ම එය සරසවි අධ්‍යාපනයක් නොවන්නේය. සරසවිය යනු දේශණ පවත්වන තැනක් පමණක් ම හෝ දේශන පැවැත්වීම ප්‍රධාන කොටගත්තක්ම හෝ නොවන්නේය. දේශන පැවැත්වීමට සිසුන් විශ්වවිද්‍යාලයට කැඳවීම අවශ්‍ය නොවන්නේය. එතරම් වියදමක් විශ්වවිද්‍යාලය වෙනුවෙන් නොදරා, සිසුන්ට ද එතරම් වියදමක් නොවන පරිදි ගුවන්විදුලිය හෝ රූපවාහිනී මාධ්‍යයකින් හෝ දේශන ගෙදරටම ලබාදිය හැකිය. එහෙත් එසේ නොකොට සරසවියට සිසුන් කැඳවනුයේ සරසවිය උගන්වන තැනකට වඩා ඉගෙන ගන්නා තැනක් බැවිනි. සිසුන් සරසවියට පැමිණිය යුත්තේ දේශනවලින් මගපෙන්වීම් හා මූලික අධ්‍යාපනයක් ලබා ස්වයං අධ්‍යයනයක යෙදීම පිණිසය. එය පැයක් දෙකක් විශ්වවිද්‍යාලයේ රැඳී සිට කළ හැක්කක් නොවන්නේය.

සිසුන් විශ්ව විද්‍යාලය තුළ අදාළ කාල පරිච්ඡේදය සපුරා ගත කළ යුතුය. ඒ කාලයේදී පුස්තකාල පරිශීලනය කළ යුතුය. එමගින් පරිපූර්ණ අධ්‍යාපනයක් ලැබිය හැකිය. සරසවියක හදවත වන්නේ පුස්තකාලයයි. සිසුන් නිතර සිටිය යුත්තේ පුස්තකාලයේ ය. අපේ සරසවියේ විශාල පුස්තකාලයක් පවතී. විශාල පොත් සංඛ්‍යාවක්ද සඟරා සංඛ්‍යාවක් ද එහි පවති. අති විශාල ධනස්කන්ධයක්

වියදම් කරමින් පොත්පත් හා සඟරා මිලදී ගෙන සිසුන්ගේ හා ආචාර්යවරුන්ගේ භාවිතය සඳහා සුලභ කෙරේ. විශාල වියදමක් දරා පුස්තකාල පහසුකම් දියුණුකර තිබේ. එහෙත් ඛේදවාචකය වන්නේ සරසවි පුස්තකාලය මැනවින් භාවිත නොවීමය. විභාග කාලයට සටහන් පාඩම් කිරීමට පුස්තකාලයට යන අය ඇතත් විභාග නොමැති කාලයේ සිසුන් අතලොස්සක් සඳහා විශ්ව විද්‍යාල පුස්තකාලය සීමා වී ඇත්තේය. පුස්තකාල පරිශීලනයට මහත් අලසකමක් බොහෝ සිසුන් තුළ පවතී. විශ්වවිද්‍යාලය සිසුන් ස්වෝත්සාහයෙන් ඉගෙනීමෙහි යෙදෙන ස්ථානයක්ය යන ආකල්පය බොහෝ දෙනෙකු තුළ නොපවතී. ඒ නිසා පුස්තකාලයට යෑමට අභිප්‍රේරණයක් ද නැත්තේය. ඉඳහිට යම් පැවරුමකට කරුණක් දෙකක් සොයා ගැනීමට පුස්තකාලයට යන්නෝ සිටිති. නොකඩවා පුස්තකාලය පරිශීලනය කිරීම පුරුද්දක් වී ඇත්නම් ඒ සීමිත සිසුන් පිරිසක් අතර පමණි. බහුතරය පුස්තකාලයට නොයති. එසේ නොයනුයේ කාලය පිළිබඳ ගැටලුවක් නිසා නොවේ. පුස්තකාලය පරිශීලනය කරමින් සරසවියේ ශිෂ්‍ය කාර්යභාරය මැනවින් ඉටුකරලීමේ කැපවීමක් නොමැතිකම නිසාය. මේ වූ කලී මහත් අභාග්‍ය සම්පන්න තත්ත්වයකි. පුස්තකාලයට නොගොස් ලබන උපාධියේ ගුණාත්මකභාවය කවර ස්වභාවයක් ගන්නේ ද යන්න වටහා ගැනීම දුෂ්කර නොවන්නේය.

පරිපූර්ණ උපාධියක් ලැබීමට නම් අනිවාර්යයෙන්ම පුස්තකාලය පරිශීලනය කළ යුතුය. සරසවියේ දී ශිෂ්‍යයා වගකීමෙන් යුතු පුද්ගලයෙකු විය යුතුය. ආවාට ගියාට කටයුතු කරන්නෙකු නොවිය යුතුය. උපාධිය කෙසේ හෝ සමත් කිරීමට නොව



වඩාත් උසස් ගුණාත්මක භාවයෙන් යුත් දැනුමක්, පරිචයක් ලබා ගැනීමට වෑයම් කිරීම තදින් සිතට ගත යුත්තකි. පුස්තකාලය පරිශීලනයෙන් සිසුන් මඟහැරී යන්නේ කෙසේද යන්න මෙහිදී අවබෝධ කර ගැනීම වැදගත්ය.

එක් හේතුවක් නම් පුස්තකාල පරිශීලනය සාමාන්‍ය දෙයකට වඩා අසාමාන්‍ය දෙයෙක් ලෙස සිසුන් අතර ආකල්පමය වශයෙන් ස්ථාපනය වී තිබීමය. එසේ වී ඇත්තේ විශාල පිරිසක් පුස්තකාලයට නොගොස් සිටීම හා නිකරුණේ අල්ලාප සල්ලාපයේ යෙදීම නිසාය. නැත්නම් දේශපාලන හා වෙනත් පක්ෂ ක්‍රියාකාරකම් සඳහා කැප වීම හේතුවෙන්ය. මේ කරුණු දෙකම සිසුන් පුස්තකාලයට යෑම වළක්වා ලන්නේය.

නිකරුණේ කථා කරමින් කාලය ගත කරන සිසුන් විශාල වශයෙන් විශ්ව විද්‍යාල භූමිය තුළ දක්නට ලැබේ. පාඩම් කිරීම, සමූහ සාකච්ඡා පැවැත්වීම ආදිය සඳහා සරසවි උයන තුළ ඉදිකොට ඇති විශේෂ කුටි හා බංකු ආදියෙහි නිසීදන පහසුකම බොහෝ විට භාවිතවන්නේ අල්ලාප සල්ලාප හා සම්ප්‍රපලාප දෙඩීම සඳහාය. සිසුන් කථා කළ යුතුය. අන්තර් ක්‍රියාකළ යුතුය. එහි වාදයක් නැත. එහෙත් සමස්ත සරසවි දිවියම තැන තැන කථා කර කර සිටීමට යෙදවුව හොත් ඇති ඵලය කුමක්ද? කථාව ද ඇබ්බැහි වන්නකි. මිතුරන් සමඟ කථා කිරීමෙන් කාලය ගත කිරීමට පුරුදු වුවහොත් එය කථා ඇබ්බැහියක් වන්නේය. මේ කථා ඇබ්බැහියේ ප්‍රධාන වශයෙන් ඇත්තේ මාතෘකා දෙකකි. එක්කෝ ආදරය ගැන කථා කරති. නැත්නම් දේශපාලනය හෝ යුද්ධය ගැන කථා කරති. මේ කථා දෙවර්ගය සඳහා සිසුන්ගේ

කාලය විශාල වශයෙන් වැය වන අතර එකී මාතෘකා කතාකරන තැනකට රැස්වන අය අගුල්පත් දෙමින් කථාව පෝෂණය කරනවා මිස කථාව අවසන් කර විසිර යන්නේ නැත. විශේෂයෙන්ම නේවාසිකාගාරවලද මේ කාල නාස්තිය පවතී.බොහෝ රැවෙන තුරු නේවාසිකාගාරවල සිසුහු අවදිව සිටිති. රාත්‍රී එක දෙක පමණ වන තුරු උක්ත මාතෘකා ගැන හෝ වෙනත් ඕපා දූප ගැන හෝ කථා කරමින් කාලය කා දැමීමට පුරුදුව සිටින බව පෙනේ.

මෙවැනි පරිසරයක් තුළ පොතක් පතක් බලන්නා අසාමාන්‍ය වන අතර කාලය නාස්ති කරන්නා සාමාන්‍ය වන්නේය. කණ්ඩායමක් තුළ තමා අසමාන වීමට අකැමැති බැවින් සාමාන්‍යකෙනෙකු විම සඳහා පොත අතහැර හෝ පුස්තකාලයට නොගොස් කතාවටම බර වෙති. මේ තත්ත්වය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අතර බහුලව පවතී.

එසේම තවත් දුර්ලක්ෂණයක් වන්නේ පාඩම් කිරීම හා කියවීම අතර පටලැවිල්ලය. විභාගයට පාඩම් කළාම ප්‍රමාණවත්ය යන හැඟීම ප්‍රබලව පවතින අතර පාඩම් කිරීම විභාග ආසන්නයේ සිදුකළ යුතු බවට ද ප්‍රබල හැඟීමකි. කියවීම වූ කලී පාඩමකට හෝ දේශනයකට හෝ අදාළව මෙන්ම පොදුවේ නැණ නුවන වර්ධනය සඳහා අනුගමනය කළ යුත්තකි. බොහෝ දෙනෙකුගේ සිත්සතන් තුළ කියවීම පිළිබඳව ඇත්තේ අඩු තක්සේරුවකි. කළත් නොකළත් කමක් නැත. යන ආකල්පයකි. අනිවාර්ය කරන ලද කියවීමක් වුවද නොකර බැරි නිසා කරනවා මිස ස්වේච්ඡාවෙන් කරන්නේ නොවේ. මේ නිසා පාඩම් කරන කාලය තුළ පාඩම් කිරීම සාමාන්‍ය දෙයෙක් වන අතර අනෙක් කාලය තුළ පාඩම් කිරීම හෝ කියවීම අසාමාන්‍ය වී



ඇත. කියවීමට කාලය මිඩංගු කරමින් තම සරසවි ජීවිතයේ ප්‍රධාන තැනක් ඊට දිය යුතු වුවත් සිදුවන්නේ එහි අනෙක් පැත්තය. මේ අතර නොකියවීමට කෙරෙන බලපෑමක් ද ඇත්තේය. බොහෝ සිසුන් පොතපත නොකියවන අතර කියවන්නන් දෙස අමුතු බැල්මක් හෙලමින් කියවීම අධෛර්යවත් කරන බවද පෙනේ . එය ඉතා සූක්ෂමව කෙරෙන්නෙකි. යමෙක් පොතක් අතේ තබා ගෙන සිටින බව දකින අනෙකාත් පොතක් ගෙන කියවීමට පටන් ගැනීමත් එමගින් බාධාවකින් තොරව දෙදෙනගේම කියවීම තහවුරු කර ගැනීම සිදුවිය යුතු දෙය වුවත් සැබැවින්ම සිදුවන්නේ කියවන්නාට බාධා කිරීමය. පොතම අතේ තබාගෙන සිටින්නේ පංති සාමාර්ථ්‍යයක් ගැනීමට ද, ආචාර්ය මණ්ඩලයට ඇතුළත් වීමට ද ආදී වශයෙන් ඔච්චම් කරන්නෝ ද සිටිති. මේ අතර විවිධ විග්‍රහ මගින් කියවන්නන්ගේ එම චර්යාව යටපත් කෙරෙන බව ද පෙනේ. තමන් නොකියවන අතර අනුන් කියවීම ගැන ඊර්ෂ්‍යා කරන්නෝ ද සරසවියේ සිටිති.

සරසවියේ රැඳී සිටීමටත්, නේවාසිකාගාරවල ජීවත් වීමටත් ලැබෙන අවස්ථාව අධ්‍යාපනය සඳහා ඉතා වැදගත් වුවත් පොතපත කියවීමට හා ශාස්ත්‍රීය කටයුතුවල යෙදීමට එම පහසුකම් භාවිත නොවන තත්ත්වයක් උදා වී ඇත්තේය. ගෙදර සිට එන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට රාත්‍රී කාලය හා නිවාඩු කාලය ගෙදර ගත කිරීමේ හැකියාව තිබෙන අතර පොත පත කියවීම හා අනෙකුත් අධ්‍යාපනකි කටයුතු සඳහා එම කාලය යොදා ගත හැකිය. ගෙදර සිට එන සිසුන්ට විවිධ ගැහැට ද නැතුවා නොවේ. ගෙදර දොර ඉඩකඩ ප්‍රශ්න ද, දෛනික ආර්ථික ප්‍රශ්නද, වෙනත් පවුලේ ගැටලු ද තිබේ. ගෙදර සිටින විට එකී ගැටලුවල බලපෑමට

ලක්වීම නොවැළැක්විය හැකිය. අධ්‍යාපනය සඳහා තිබෙන කාලය පවුලේ කටයුතුවලට යෙදවීමට සිදු වීම නිසා ගෙදර සිටීම අවාසියක් වන අවස්ථා ද ඇත්තේය. ඒ අතර නේවාසිකව සිටින සිසුන්ට සාපේක්ෂව ගෙදර සිටින සිසුන්ට පාඩම් කිරීමේ හා පොත පත කියවීමේ අවස්ථාව හොඳින් ලැබෙන පවුල් ද තිබේ. කතා කරමින් කාලය කා දැමීමට නේවාසික සිසුන් පෙළඹී සිටින අතරතුරු ගෙදර සිට එන සිසුහු කාලය උපරිම වශයෙන් ශාස්ත්‍රීය කටයුතු සඳහා යොදා ගන්නා බව පෙනේ.

විශ්වවිද්‍යාලයේ නේවාසිකාගාර ජීවිතය සතුටින් ගත කරන අතර අධ්‍යාපනය සඳහාම කැපකිරීම කෙරෙහි සිසුන් යොමු විය යුතුය. නේවාසිකාගාර සංස්කෘතිය ශාස්ත්‍රීය කටයුතුවලට මුල් තැන දෙන්නක් විය යුතුය. එසේ නොකොට සරසවියේ නේවාසිකාගර පහසුකම් ලැබීමේ පලයක් නැත්තේය. රැකියාවක් සඳහා යම් ස්ථානයක නේවාසිකව සිටීමත් අධ්‍යාපනය සඳහා නේවාසිකව සිටීමත් අතර වෙනසක් පවතී. රැකියාවට යන අයට නිදහසේ නේවාසිකාගාර තුළ විනෝදයෙන් කාලය ගත කළ හැකිය. එහෙත් අධ්‍යාපනික කටයුත්තක් සඳහා නේවාසිකව සිටින්නාට එසේ කාලය නාස්ති කළ නොහැකිය. ඔහු හෝ ඇය සිය අධ්‍යාපනය වෙනුවෙන් නේවාසිකව සිටින අතර එම නේවාසිකාගාර ජීවිතය ශාස්ත්‍රීය කටයුතුවලට කැප කළ යුතුය. මෙහිදී ගොඩ නගාගත යුතු පෞරුෂ ගුණාංගය වන්නේ කවුරු කුමක් කීවත්, කෙසේ ප්‍රතිචාර දැක්වූවත් තමන්ගේ ශාස්ත්‍රීය කටයුතුවලට මුල් තැන දීමය.



පෞද්ගලික නවාතැන්වල සිටින සිසුන් අතරද පොතපත කියවීමට යොමු වූ අයට වඩා පොත පත නොකියවා කාලය කතාබහට හෝ රූපවාහිනී ආදිය බැලීමට යොදවන අය සිටින බව පෙනේ. අප විමසා බලන සෑම අවස්ථාවකම සිසුන්ගේ ප්‍රතිචාරය වූයේ බෝඩිමේ පාඩම් කිරීමට හෝ වෙනත් කියවීම් සඳහා හෝ හැකියාවක් ඇත්නම් විභාග ආසන්න කාලයේ පමණක් බවය. සෙසු කාල පරිච්ඡේදවලදී කියවීමට යොමු නොවන නිසා තමන්ට පමණක් එය දුෂ්කර වී ඇතැයි ඔවුහු ප්‍රකාශ කළහ. පෞද්ගලික නවාතැන්වල සමූහ වශයෙන් සිටින සිසුන්ට මේ ඉරණම අත් වී තිබේ. කරනු ලබන පිරිවැයට සාපේක්ෂව බලන කල්හි ඔවුන්ගේ මේ චර්යාව කාලය මෙන්ම ධනය ද නාස්ති කිරීමකි.

ඉගෙනීම විශ්වවිද්‍යාලයක ප්‍රධාන විය යුතු බැවින් සියලු සිසුන් ඉගෙනීමේ අභිප්‍රේරණයෙන් යුත් පෞරුෂයක් ගොඩ නගා ගැනීම අත්‍යවශ්‍ය වන්නේය. නිතර පොතපත කියවීම, එයින් දැනුම හා කුලතා වර්ධනය කර ගැනීම ගැන කල්පනාකාරී විය යුතුය. විශ්ව විද්‍යාලය තුළ වසර තුනක් හෝ හතරක් ගත කරනු ලබන අතර මේ කාලය ඉතා සීමිත කාලයකි. මෙම කාලය ප්‍රයෝජනයට නොගත හොත් අනාගතයේදී එම විපාක ලැබෙන්නේය. පෙර සිටි උපාධි අපේක්ෂකයන්ට වඩා විශාල අභියෝගයක් වර්තමාන උපාධි අපේක්ෂකයන් ඉදිරියේ පවතී. සරසවි සිසුන් සංඛ්‍යාව ඉහළ යන අතර රැකී රක්ෂා එම අනුපාතයට ඉහළ නොයන්නේය. එයින් තරගය උත්සන්න වන්නේය. පෞද්ගලික සරසවි හෝ වෙනත් විදේශ අධ්‍යාපනික ආයතනවලට අනුබද්ධව උපාධි ලබන්නන්ගේ සංඛ්‍යාව ද දින දින ඉහළ යයි. මෙවැනි

පරිසරයක් තුළ ජාතික විශ්වවිද්‍යාලවල සිටින සිසුන්ට කාලය උපරිම වශයෙන් ඉගෙනීමට ම යෙදීමටත් දනුමෙන් ඉතා හොඳින් සන්නද්ධ වීමටත් සිදු වේ.

මෙම අභියෝගයට මුහුණ දීම දුෂ්කර නොවන්නේය. මෙට ජාතික විශ්ව විද්‍යාලවලට ඇතුළත් වන සිසුන්ට රටේ ආර්ථික තත්ත්වයට සාපේක්ෂව ඉතා හොඳ පහසුකම් ලැබේ. ශිෂ්‍යාධාර හෝ ශිෂ්‍යත්ව සෑම ශිෂ්‍යයෙකුට ම පාහේ ලැබේ. නේවාසිකාගාර පහසුකම් ද ඉතා අවම මිල ගණන් යටතේ ලැබේ. ඒ අතර අධ්‍යාපනයට ද එතරම් පිරිවැයක් නැත්තේය. අවශ්‍යව ඇත්තේ ශිෂ්‍යයාගේ කැපවීමය. පූර්ණ නිමග්න ඉගෙනුම් ක්‍රියාවක්ය. වර්තමානයේ ඕනෑම ක්ෂේත්‍රයකින් විශේෂඥතාවයක් ලබන කෙනෙකුට මෙරට හෝ පිටරට තැනක් තිබේ. ඊට කලා, වාණිජ, විද්‍යා, වෛද්‍ය විද්‍යා, ඉංජිනේරු කියා වෙනසක් නැත්තේය. යම් කෙනෙක් පාලි භාෂාව ප්‍රගුණකොට වසර හතරක් තුළ උසස් පණ්ඩිවරයෙකුගේ තත්ත්වයට ස්වයං අධ්‍යයනයට මුල්තැන දී සරසවි අධ්‍යාපනය සාර්ථක නිම කරන්නේ නම් ඔහුට හෝ ඇයට රැකියාව පිළිබඳ කිසිදු අභියෝගයක් නැත්තේය. හේතුව එම ක්ෂේත්‍රවල විශේෂඥයන් අඩුවීමය. සංස්කෘත භාෂාව හෝ වේවා සිංහල භාෂාව හෝ වේවා ඉංග්‍රීසි භාෂාව හෝ වේවා තත්ත්වය එසේය. අද සිංහල භාෂාව උපාධියට හදාරණ අය සිටියත් නිවැරදි සිංහල භාෂාව හඳුනන හා භාවිත කරන අය සිටිනුයේ අල්ප වශයෙනි. ඒ නිසා බොහෝ පුවත්පත් ද සඟරා ද ලිපි ලේඛන ද සංස්කරණය දුර්වල වී භාෂා දුර්ගුණ බහුලව පළ වේ. ජාතික පුවත්පත්වලත් බස් දොස් බහුලව තිබේ. බොහෝ උගතුන් යැයි කියා ගන්නා අය කතා කරන විට සිංහල මැරේ. කර්මකාරක



කර්තෘකාරක පැටලේ. උක්ත ආඛ්‍යාත නොගැළපේ. විශේෂණ වරනැගීම අසාර්ථකය. හිතෙන හිතෙන ආකාරයට සිංහලය හැසිර වේ. භාෂා ශික්ෂණයක් ඇත්තේම නැත. මේ පසුබිම තුළ සිංහල ප්‍රගුණ කළ හොත් තැනක් ගැනීම පිළිබඳ අභියෝගයක් නැත්තේය. සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව, ගණිතය, විද්‍යාව, කළමනාකරණය ආදී සෑම ක්ෂේත්‍රයකටම මෙම කරුණ අදාළ වන්නේය. මේ සෑම ක්ෂේත්‍රයකම උපාධිධාරීන් සිටින නමුත් ඔවුහු මනා ප්‍රවීණත්වයක් සහිත වූවෝ නොවෙති.

මෙහිදී වැදගත්වන මූලධර්මය නම් සමානයන් අතර අසමානයෙක් හෙවත් ඌනතාවලින් යුත් අය අතර පරිපූර්ණ කෙනෙක් වීමය. සියලු උපාධිධරීහු විවිධ ඌනතා සහිත අයවන විට ඒ ඌනතා ජයගත් කෙනා විශේෂ කෙනෙක් වන්නේය. සමානයන් අතර අසමානයෙක් කියා ප්‍රකාශ කළේ මේ අර්ථය පැහැදිලි කිරීමටය. අද රැකියා වෙළෙඳපොලේ වහාම රැකියාවකට යනුයේ මෙම අසාමානයා ය. ඔහු හෝ ඇය අනෙක් අය අභිබවා පියවර කීපයක් ඉදිරියට ගොස් ඇත. සරසවිය තුළ විශාල පිරිසක් උපාධිය ලැබීම ම ප්‍රමාණවත් කොට සලකා කාලය නාස්ති කරන අතරතුර කාලය මැනවින් කළමනාකරණය කොට උසස් මට්ටමෙන් උපාධියත් වෙනත් භාෂා හා තොරතුරු තාක්ෂණ ආදී කුසලතාත් දියුණු කරගත් අය වහා හොඳ රැකියාවලට යති. එය පසුගිය කාලය තුළ රැකියාවක් ලැබීමේ රහසක් වී ඇත. එනම් සියල්ලන් සමාන මට්ටමේ සිටින අතර තමන් ඔවුන් අභිබවා විශේෂ පුද්ගලයෙකු වන ආකාරයට පූර්ණ අධ්‍යාපනයක් ලැබීමට කැපවීමය. මෙයින් පාඩමක්

ඉගෙන ගෙන අපේ සරසවි සිසුන් හොඳින් දැනුමෙන් හා කුසලතාවෙන් සන්නද්ධ වුවහොත් රැකියා පිළිබඳ අභියෝගය ජයගත හැකි වන්නේය.

මෙය පහසුවන්නේ සරසවියට ප්‍රවේශ වූ දා සිට නිරන්තරයෙන්ම අධ්‍යාපනයට කැපවීමෙන් අන් අය කුමන් කළත් කීවත් ඒ ගැන තැකීමක් නොකොට සරසවි ජීවිතය සියයට සියයක්කම අධ්‍යාපනයට ම කැප කිරීමෙන්ය. පුස්තකාලයේම ගැවසීමෙන්ය. තොරතුරු තාක්‍ෂණය පරිහරණය කිරීමෙන්ය. එමගින් යම් ඉලක්කයකට අභිමුඛව කුසලතා සම්පූර්ණ කර ගැනීමට අභ්‍යාසයේ යෙදිය යුතුය. හිත ඇත්නම් පත කුඩා නොවන්නේය. අරමුණු සිතු තරමටත් වඩා සාධනය වන්නේය. තම විශ්වවිද්‍යාල ජීවිතය සැලසුම් කර ගැනීම මෙහිදී වැදගත් වන්නේය. එම සැලැස්මට අවශ්‍යයෙන්ම ඇතුළත් විය යුතු කරුණු කීපයක් පහත සඳහන් වන්නේය.

## 2 දේශනවලට සහභාගිවීම

මෙකී කරුණු බොහෝ අංශයන් ගැන කල්පනා කිරීමෙන් අනතුරුව ගොනු කළ ඒවාය. දේශනවලට සහභාගී වීම ප්‍රථම කරුණය. අද්‍යතන සරසවි සිසුන් අතර සැලකිය යුතු ප්‍රතිශතයක් දේශනවලට සහභාගී නොවෙති. සමහරෙක් මේ අතින් ඉතාම දුර්වල තත්ත්වයක පසුවෙති. රැකියාවක හෝ ගෙදර දොර යම් කටයුත්තක හෝ නියැලෙන අතර වෙනත් අය ලවා සටහන් ලියවා ගනිති. ඒ සටහන් බලා විභාගය යන්තමින් ගොඩ දා ගනිති. නැත්නම් අසමත් වී දිගින් දිගටම ආචාර්යවරුන් හෝ පීඨාධිපතිවරුන් හෝ පසු පස පින්සෙන්ඩු වෙති. මෙවැනි අභාග්‍ය සම්පන්න සිසුන් කීප දෙනෙක් හෝ සෑම වසරකම හමු වේ.



බාහිර උපාධියක් කරන්නා සේ විශ්වවිද්‍යාලයට පැමිණෙන ඔවුන්ගේ කුසලතා කිසිවක් දියුණුවන බවට සාක්ෂියක් නැත්තේය.

මේ අතර තවත් දුර්වලතාවක් නම් සමහර දේශනවලට සහභාගී වන අතර සමහර ඒවාට විවිධ පදනමින් සහභාගී නොවීමයි. සමහරු ආචාර්යවරුන් තෝරති. තවත් සමහරු වේලාව තෝරති. තවත් අය විෂයේ පහසු හෝ දුෂ්කරතාව හෝ සලකා තෝරති. මෙම තේරීම නිසා අවාසිය සිදුවන්නේ ගුරුවරුන්ට නොව සිසුන්ටමය. මධ්‍යාහ්න හෝ අපරාහ්න කාලය තුළ පැවැත්වෙන දේශනවලට සහභාගී වීමට මැළි වන්නෝ සිටිති. ඒ නිදි කිරා වැටෙන බවට ඇති ආකල්පය හෝ ඒ වේලාවල පවත්නා විෂයන්ගේ දුෂ්කරතාව සලකාගෙනය. බොහෝ ඉංග්‍රීසි පංතිවලට සිසුන් සහභාගී නොවන්නේ ඒවා පවත්වන වේලාව දවසේ දුෂ්කරම වේලාව යැයි සලකාගෙනය. ඉගෙනීමට උනන්දුව ඇත්තාට වේලාවේ හෝ කාලගුණයේ හෝ දේශගුණයේ ප්‍රශ්නයක බලනොපාන්නේ ය. "විද්‍යාතුරානාම් න සුඛං න නිද්‍රා", දැනුම ග්‍රහණය කර ගැනීමෙහිලා වෙහෙසෙන්නා සැප හා නින්ද නොතකන්නේ ය යනු එහි අර්ථයයි. සැබැවින්ම සැප හා නින්ද තැකුව හොත් ඉගෙනීම අඩපණ වේ. විභාග සමත් කිරීම ම ප්‍රමාණවත් නොවේ. පරිපූර්ණ අධ්‍යාපනයක් සහිතව විභාග හොඳින් සමත් කළ හැකි වන්නේ නින්දත් සැපයත් අවශ්‍ය ප්‍රමාණයට කැප කිරීමෙන්ය.

## 3 දේශනවලට අදාළ විෂය ඥානය දියුණු කිරීම

සරසවි සිසුන් උනන්දු නොවන ප්‍රධාන කරුණක් වන්නේ දේශනවලට අදාළ විෂයයන්

පිළිබඳව නොකිය වීමය. නැත්නම් ඌන කියවීමය. මේ කරුණ ඉහත දී විස්තර කෙරිණි. සැබැවින්ම සරසවිය යනු කියවා ඉගෙන ගන්නා, පර්යේෂණකොට ඉගෙන ගන්නා, අත්හදා බැලීම්කොට ඉගෙන ගන්නා, වාද, සංවාද, ප්‍රවාදකොට ඉගෙන ගන්නා තැනක් මිස දේශනයක් පිටපත් කරගන්නා තැනක්ම නොවන්නේය. දේශන වැදගත්ය. ඒවා වැදගත් වන්නේ සුමගට, නිවැරදිව දිසානතියට සිසුන් යොමුකරලීමටය. කියවීම තුළින් පෝෂණයක් ලැබීමට අවශ්‍ය අමුද්‍රව්‍ය, මාර්ගෝපදේශ සැපයීමට ය. මෙහිදී ආචාර්යවරුන් විසින් කියවීම් නිර්දේශ කරනු ලැබීම ම අපේක්ෂාවෙන් නොසිටිය යුතුය. වැඩිහිටි බුද්ධිමත් සිසුන් හැටියට මූලාශ්‍රය සොයා සොයා බැලීමේ හැකියාව කාටත් තිබේ. ස්වයං උත්සාහයෙන් අදාළ කෘති සොයා සපයා කියවීම සිසුන්ගේ වගකීමක් වන්නේය. පුස්තකාලය ද, අන්තර්ජාල පහසුකම් ද, වෙනත් තාක්ෂණික උපකාරද විශ්වවිද්‍යාලය තුළ සුලභ කොට තිබෙන්නේ මේ සඳහාය.

## 4 වෙනත් ක්ෂේත්‍රවලට අදාළ කියවීම

කියවීම වූ කලී තම විෂය ක්ෂේත්‍රයටම සීමා කළ යුත්තක් නොවන්නේය. විෂය දැනුම මෙන්ම දැනගත යුතු තවත් බොහෝ දෑ තිබේ. ශ්‍රී ලංකාවේ සිසුන් පූර්ණ උපාධිධරයන් වන විට සිය රට ගැන අවබෝධයක් ලබා නැත්නම් එය මහත් අඩුවකි. ඊට රටේ ඉතිහාසය, දේශපාලනය, සංස්කෘතිය, පරිසරය, සංවර්ධනය, ජනගහනය, ආගම, උත්සව සම්භාෂණ, අන්තර්ජාතික සබඳතා ආදිය ඇතුළත් වේ. සමාජ විද්‍යාව හදාරන්නා මෙන්ම ගණිතය, වෛද්‍ය විද්‍යාව, වාණිජ්‍යය, සත්ත්ව විද්‍යාව ආදිය හදාරණ සිසුන් ද තමන්ගේ රට ගැන දැනගත යුතුය. ඔවුන්



පුස්තකාලයට ගොස් අතිරේක කියවීම් ලෙස රටේ විවිධ කරුණු ගැන දැනගත යුතුය. උපන් බිම ගැනවත් නොදැනීම තරම් දුර්වලතාවක් තවත් නැත්තේය. උපාධිධරයා විශේෂයෙන්ම ලංකාවේ ඉතිහාසය කියවූ කෙනෙක් විය යුතුය. ඊට විෂය ප්‍රභේදයක් අදාළ නොවන්නේය. අභිමානවත් උපාධිධරයෙකු වන්නේ යම් විෂයක් පමණක් දත් පමණින් ම නොවේ. එම විෂය පරිචය සමඟ තමා සිටින සමාජය එහි ඉතිහාසය හා වර්තමානය දැන සිටීමෙන්ය.

එබැවින් සෑම සරසවි ශිෂ්‍යයෙකුම ශිෂ්‍යාවකම ඉතිහාසය දත මනාය. එසේම රටේ දේශපාලන, පරිපාලන ක්‍රියාකාරීත්වය කාලීන අර්බුද පමණක් නොව විවිධ ප්‍රවණතා ආදිය පිළිබඳ අවබෝධයක් ලබා ගත මනාය. එසේම විවිධ විෂය ක්ෂේත්‍ර පිළිබඳව ද සංසිද්ධි පිළිබඳව ද පළවන ප්‍රකාශන කියවීමෙන් උපාධිධාරියාගේ වටිනාකම වැඩිවන්නේය.

## 5 පුස්තකාලයේ පවත්නා සඟරා කියවීම

පුස්තකාලයේ පවත්නා සඟරා කියවීම ඉතා අවම වශයෙන් සිදුවන බව සඟරා අංශ පරීක්ෂා කිරීමේදී පෙනී යන්නේය. අපේ සරසවියේ සඟරා අංශයට සඟරා විශාල සංඛ්‍යාවක් ගෙන්වනු ලැබේ. ඒ සඟරා සෑම විෂය ක්ෂේත්‍රයකට ම අදාළව තෝරා ගත් ඒවාය. විවිධ රටවල කරනු ලබන පර්යේෂණ ඥානය, නව සංකල්ප හා න්‍යාය අපට ලැබෙනුයේ සඟරා මාර්ගයෙන්ය. සමාජ විද්‍යාව, මානව විද්‍යාව හා අපරාධ විද්‍යාව හදාරන්නා ලෝකයේ පළවන ප්‍රධාන සඟරා අඛණ්ඩව කියවිය යුතුය. එමගින් එම ක්ෂේත්‍රවල විෂය ඥානය ලබා ගත හැකිවන්නා සේම දැනුම යාවත්කාලීන ද වන්නේය. ගණිතය, විද්‍යාව, ආදියට

මෙන්ම වෛද්‍ය විද්‍යාව ආදියට අදාළව පළවන පිළිගත් සඟරා වැදගත් වන්නේ එම විෂයන් තෝරා ගත් සිසුන්ට පමණක්ම නොවේ. තමාගේ විෂයට අදාළ සඟරා මෙන්ම වෙනත් විෂය ක්ෂේත්‍රවලට අදාල සඟරා ද පෙරළා පටුන බැලිය යුතුය. එසේ බලන කල්හි තමන්ට වැදගත් වන බොහෝ දෑ හමුවන්නේය. මා මේ යෝජනාව හා උපදේශය මතු කරනුයේ අපේ සිසුන්ගේ සීමාසහිත දෘෂ්ටිය පුළුල් කරනු සඳහාය. සාමාන්‍ය චර්යාව අනුව විද්‍යාව හදාරන සිසුහු සමාජීය විද්‍යා සඟරා පැත්තවත් නොබලති. ඒ අයුරින්ම සාමාජීය විද්‍යා හෝ මානව ශාස්ත්‍ර හදාරන්නෝ විද්‍යා සඟරා හෝ වෛද්‍ය විද්‍යා සඟරා පැත්තවත් නොබලති. ඒවා අපට අදාළ නැත යන ආකල්පය මෙහිදී ප්‍රබලව බල පැවැත්වේ. එය සරසවි වරමේ වැදගත් සම්පත් ප්‍රමාණයක් අහිමි කරනු ලබන ආකල්පයකි. සාමාන්‍ය දැනීම හා අවබෝධය සඳහාත් ජීවන පරිචය උද්දීපනය කර ගැනීම සඳහාත් විවිධ ක්ෂේත්‍රවලට අදාළව කාලීන විද්‍යාර්ථීන් කියන්නේ මොනවාද යන්න දත යුතුය. එසේ දැන ගැනීමෙන් සෙතක් මිස අලාභයක් නොවන්නේය.

## 6 පුස්තකාලයේ පවත්නා පුවත්පත් කියවීම

පුවත්පත් කියවීම ද බොහෝ දෙනෙකුට හුරු දෙයකට වඩා නුහුරු දෙයකි. හුරුවක් ඇත්නම් රැකියා ඇබෑර්තු ආදිය කියවීම සඳහාය. ලංකාවේ ආර්ථික තත්ත්වය අනුව පුවත්පත් මිලදී ගැනීමේ හැකියාව ඇත්තේ අතලොස්සකට පමණි. ඒ නිසා ම පුවත්පත් කියවීමේ හුරුව ඇත්තේ සීමිත පිරිසකට පමණි. ග්‍රාමීය ප්‍රදේශවල විශාල පිරිසකට පුවත්පත් කියවීමේ හුරුව පවතිනුයේ ඉතා අඩුවෙන්ය. සරසවියට පැමිණෙන විට පවත්නා මෙම ලක්ෂණය වෙනස් කර



ගැනීමට අවශ්‍ය සම්පත් තිබේ. සරසවියේ පුස්තකාලයේද වෙනත් ස්ථාන කීපයක ද එදිනෙදා පුවත්පත්, කියවීම සඳහා සුලභ කොට තිබේ. ඒවා නොකඩවා කියවීමට සිසුන් පුරුදු විය යුතුය.

පුවත්පත් කියවීමට ස්වකීය ගෙදර දී නොලැබෙන අනගි අවස්ථාවක් සරසවියේදී ලැබෙන හෙයින් ඉන් ප්‍රයෝජනයක් නොගැනීම කණගාටුවකි. ලංකාවේ පළවන ප්‍රධාන පුවත්පත් සියල්ලම පාහේ පුස්තකාලයේ තිබේ. ඒවායේ ප්‍රවෘත්ති පමණක් නොව විවිධ කරුණු සඳහන් වේ. සෑම දිනකම යම් වේලාවක් වෙන් කොට පුවත්පත් බැලීමේ පුරුද්දක් සෑම ශිෂ්‍යයෙක්ම දියුණු කරගත යුතුය. මේ සඳහා විශ්වවිද්‍යාලයේ නේවාසිකව සිටීම අවශ්‍යම නොවේ. වෙනත් ස්ථානවල සිටින සිසුන් ද සරසවියට පැමිණ යම් වේලාවක් වැදගත් පොත පත කියවීමට ද යම් වේලාවක් පුවත්පත් කියවීමට ද දෛනික ව කැප කළ මනාය.

## 7 විදේශ පුවත් කියවීම

විදේශ පිළිබඳව පුවත් දැන ගැනීමෙන් විවිධ රටවල් පිළිබඳ අවබෝධය වර්ධනය කිරීම සියලු සිසුන්ගේ අවධානයට යොමු විය යුත්තක් වන්නේය. අපේ බොහෝ ශිෂ්‍යයෝ විදේශ පිළිබඳ පුවත් නොකියවති. පාඩමකට, දේශනයකට අදාළ නම් පමණක් කියවති. එසේ අදාළ විය යුතු ම නැත. අප අද ජීවත් වන්නේ අතිශයින්ම ජාලගත වූ එනම් සම්බන්ධතා ජාලවලින් ගෙතුණු සමාජයකය. ලංකාවේ බොහෝ දෙනෙක් පිටරටවල ජීවත් වෙති. එසේම රැකී රක්ෂා හා වෙනත් විවිධ කටයුතුවල නිරතව සිටිති. ලෝකය වෙනදාටත් වඩා අපට සමීප

වන අතර බලපාන්නට ද පටන් ගෙන තිබේ. ලෝක වෙළෙඳපොලේ අද ඇති වන තත්ත්වය හෙටම අපටත් බලපායි. යම් රටක ආර්ථික හෝ සමාජ අර්බුදයක් අපට අදාළ නැතැයි කියා පසකට දැමීය නොහැකිය. බොහෝ රටවල්වල ඇතිවන නොසන්සුන්තාවන් හෝ විවිධ අර්බුද අපට ද විවිධාකාරයෙන් බලපාන්නේය.

ලෝකය ගැන දැන ගැනීමට උනන්දුවක් නැති අය සරසවියට පැමිණියත් තවදුරටත් ළිදේ සිටින ගෙම්බන් වැනිය. විශ්වය ගැන දැන ගැනීමට තිබෙන හොඳම ස්ථානය සරසවියයි. එහි අනන්ත තොරතුරු ඇතුළත් පොත්පත් සඟරා හා ප්‍රකාශන තිබේ. තාක්ෂනික මෙවවලම් තිබේ. නිරන්තරයෙන්ම ඒවා පරිහරණයකොට ලෝකය අතැඹුලක් බවට පත්කර ගැනීමට උනන්දු විය යුතුය.

සරසවි ශිෂ්‍යයා ස්වකීය රට ගැනද බාහිර ලෝකය ගැන ද හොඳ අවබෝධයක් ලබමින් පරිපූර්ණත්වයට පත් වූ කෙනෙක් විය යුතුමය. ස්වකීය විෂය ක්ෂේත්‍රය මීට අදාළ නොවනේනේය. වෛද්‍ය ශිෂ්‍යයන්, කළමනාකරණ ශිෂ්‍යයන්, මානව ශාස්ත්‍ර හෝ සමාජ ශාස්ත්‍ර හදාරන ශිෂ්‍යයන්, වෙනත් විද්‍යා හා කලාවන් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන් එකසේ දේශීය දැනුමෙන් ද විදේශීය අවබෝධයෙන් ද පොහොසත් විය යුතුය. ලෝක දේශපාලනය වැදගත් වන්නේ දේශපාලන විද්‍යාව හදාරන්නාට පමණක් ම නොවේ. ආර්ථික විද්‍යාව හදාරන්නාට ද එය වැදගත්ය. කලාව නර්තනය හදාරන්නාට ද එය වැදගත්ය. මේ සඳහා අභිප්‍රේරණය වීමෙන් නිරන්තරයෙන්ම ලොව ගැන දැන ගැනීමේ ආශාව ජනිත වේ. අද සන්නිවේදන මාධ්‍යය මගින් ද ලෝකයේ බොහෝ දෑ ගෙදරටම



සැපයේ. එතරම් වාසියක් පැවතියත් ඉන් ප්‍රයෝජනය ගන්නේ කීප දෙනෙක් පමණී. පුවත්පත් බැලුවත් විදෙස් පුවත් කියවන්නේ අතලොස්සකි. සරසවි සිසුන් මේ අයුරින් තමන්ගේ තත්ත්ය උසස් කරගත හොත් ඔවුන්ට අභියෝග කිරීම දුෂ්කර කටයුත්තක් වන්නේය.

විදේශ ගැන දැන ගැනීමේ දී ලෝක ඉතිහාසය කියවා බැලීම අවශ්‍යම දෙයකි. අප ජීවත්වන රට මෙන්ම ලෝකය අද තත්ත්වයට පත්ව ඇත්තේ කෙසේද? ලෝක යුද සමයේ අප කවුරුත් ජීවත්ව සිටියේ නැත. උපත ලබා ඇත්තේ පසු කාලයේ ය. එසේ වුවත් ලෝක යුද්ධ ගැන නොකියවා සිටිය නොහැකිය. අප උපත ලැබීමට පෙර ලොව කෙසේ පැවතියේද කියා දැන ගැනීමට ඉතිහාසය වැදගත් වන්නේය. කොරියානු ප්‍රශ්නය කියා අසන්නට ලැබුණු විට එයින් අදහස් වන්නේ කුමක්දැයි ඉතිහාසයෙන් බිඳක් හෝ කියවා බලා දැන ගත යුතුය.

## 8 ඉංග්‍රීසි භාෂාව වර්ධනය කර ගැනීම

දෙවන භාෂාවක් ලෙස ඉංග්‍රීසි භාෂාව වර්ධනය කර ගැනීමේ අවශ්‍යතාව මෙකල තරම් අවධාරණය වන යුගයක් නැතැයි සිතෙන්නේය. සෑම කෙනෙක් ම පාහේ ඉංග්‍රීසි ඉගෙනීමේ අවශ්‍යතාව මතු කරති. සරසවි අධ්‍යාපනයේ කොටසක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම සඳහා ද විශාල වියදමක් දැරේ. උපාධියේ අදාළත්වය හා ගුණාත්මකභාවය විෂයෙහි ගෙන එනු ලබන සියලු යෝජනාවල ඉංග්‍රීසි භාෂාව ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව දක්වේ. එසේම කඩිනම් ඉංග්‍රීසි භාෂා පාඨමාලා ද විවිධ මට්ටමෙන් පැවැත්වෙන්නේය. බොහෝ රැස්වීම්වල දී විද්වත්හු

සිසුන් ඉංග්‍රීසි ඉගෙනීමට කැප විය යුතු බව අවධාරණය කරති.

මෙතරම් ඉංග්‍රීසිය මතුකොට දක්වුව ද එය ඉගෙනීමට සිසුන් තුළ පවත්නා උනන්දුව ගැන කිසිසේත් ම සෑහීමකට පත්විය නොහැකිය. ඇතැම් පාඨමාලාවලට අදාළ සිසුන් ඉංග්‍රීසි භාෂාව හොඳින් උගෙන ගන්නා බව සැබෑවකි. එහෙත් ශාස්ත්‍ර පීඨය ඇතුළු පීඨ කීපයකට ම අයත් සිසුන් යම් පිරිසක් තවමත් අනුගමනය කරන්නේ මන්දගාමී පිළිවෙතකි. කොතෙක් අවධාරණය කළ ද ඉංග්‍රීසි ඉගෙනීමට ඇත්තේ මහත් කුසීත අලසකමකි.

මේ අලසකම පිළිබිඹු වන ලක්ෂණයකි, විශ්වවිද්‍යාලය පවත්වන ඉංග්‍රීසි පාඨමාලාවලට ඇති ඌන සහභාගීත්වය. සිසුන්ගේ සහභාගීත්වය ගැන සතුටු විය නොහැකිය. විශ්වවිද්‍යාලය පවත්වන ඉංග්‍රීසි පාඨමාලා ඔවුන් සැලකිල්ලට ගෙන ඇත්තේ ආවාට ගියාට ය. විවිධ කරුණු නිදහසට ඉදිරිපත් කරමින් තමන්ගේ ඌනතාව හා අලසකම වසා ගැනීමට සමහරෙක් යත්න දරති. සමහරෙක් ඉංග්‍රීසි අංශයට හෝ ගුරුවරුන්ට බණිති. තවත් අය පංති පවත්වන වේලාව හොඳ නැතැයි කියති. සමහරෙක් තමන්ට ගැළපෙන දෙයක් නොඉගැන්වෙන බව දක්වති. මෙවැනි කරුණු කිසිවක් සැබෑ ශිෂ්‍යයාට අදාළ නොවන්නේය. ඉංග්‍රීසිය ඉගෙනීමට උනන්දුවක් තිබේ නම් ප්‍රමාණවත් තරම් සම්පත් සරසවියේ ම තිබේ. බසක් කිසිදාක ඉබේ නොපිහිටයි. එය මහන්සියෙන් උගත යුතුමය. උගත් ප්‍රමාණයට හා පරිශීලනය කළ ප්‍රමාණයට භාෂාව පිහිටන්නේය. එබැවින් අප සියලු සිසුන්ට යෝජනා කරනුයේ කවර ඌනතා දුෂ්කරතා පැවතියද ඒ කිසිවක් ගැන තැකීමක් නොකොට



ස්වෝත්සාහයට ප්‍රමුඛස්ථානය දී සරසවියේ පවත්නා භාෂාව උගෙනීමට අදාළ සම්පත්වලින් නිසි ප්‍රයෝජන ගන්නා ලෙසටය.

භාෂාව උගෙන ගන්නා අතරතුර පුස්තකාලයේ පවත්නා ඉංග්‍රීසි පොත පතද කියවීමට පුරුදු විය යුතුය. නොතේරෙන්නේය කියා කල් දැමුව හොත් කිසිදාක කියවීමට අවස්ථාවක් නොලැබෙන්නේය. කෙනෙක් සරසවියේ වසර තුනක් හෝ හතරක් සිටිති. ඒ කාලය වුවද පූර්ණ වර්ෂ නොවේ. දින වශයෙන් ගතහොත් තෙවසරක් සිටින සිසුන් දින පන්සියයක් පමණය. මෙතරම් සීමිත වූ කාල පරිච්ඡේදයක් කොපමණ කළමනාකරණය කළ යුතුද යන්න අමුතුවෙන් විස්තර කළ යුතු නොවේ. සියලු සිසුන් සරසවියේ සිටින සියලු දිනවලින් නිසි ප්‍රයෝජන ගෙන දියුණුව සලසා ගත යුතුය. එහිදී ඉංග්‍රීසිය සඳහා ද නිසි සැලකිල්ලක් දැක්විය යුතුය.

සිංහල මාධ්‍යයෙන් පමණක් නොව ඉංග්‍රීසි මාධ්‍යයෙන් ඉගෙන ගන්නා සිසුන් ද ඉංග්‍රීසි භාෂාවර්ධනය කෙරෙහි යොමු වීමේ අවශ්‍යතාවක් පවතී. ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීම හොඳය. එම මාධ්‍යය තෝරා ගැනීම අගය කළ යුත්තකි. ඒ සිංහල හෝ දෙමළ හොඳ නැති නිසා නොවේ. භාෂා මාධ්‍යය එකසේ වැදගත්ය. සිංහල දෙමළ සිසුන් ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ලැබීමේ අභියෝගය භාර ගැනීම ඔවුන්ගේ පෞරුෂත්වයේ හොඳ ලක්ෂණයකි. ඉංග්‍රීසි මාධ්‍යය තෝරාගත් සියලු දෙනා එම භාෂාව පිළිබඳ ප්‍රවීණයෝ නොවෙති. ප්‍රවීණ සිසුන් යම් සංඛ්‍යාවක් සිටනි අතර භාෂා ප්‍රවීණතාවෙන් අඩු අය ද විවිධ හේතු පදනම් කොට ගෙන ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරීමට යොමුව සිටිති. සමහර පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි

මාධ්‍යයෙන් නම් සිසුන්ට විකල්පයක් නැති අතර කෙසේ හෝ අභියෝගයට මුහුණ දීමට සිදුවේ. සමහර පාඨමාලා භාෂා දෙකින්ම පවත්වනු ලැබුවත් විශ්වවිද්‍යාලය තුළ ඇගැයීමට ලක් වන්නේ ඉංග්‍රීසි මාධ්‍යය නම් එය මග හැරිය නොහැකි තත්ත්වයකට සිසුහු පත්වෙති. භාෂාවක් නිසා දෙවන නොවීමේ අභිලාෂයෙන් ඉංග්‍රීසියට යන්නෝ ද සිටිති.

මෙහිදී අවධාරණය කළ යුතුව පවත්නා කරුණ වනුයේ අඩු ඉංග්‍රීසි දැනුමකින් හා පරිචයකින් යුක්තව සිටින අතර ඉංග්‍රීසි මාධ්‍යයට ප්‍රවේශ වූවත් වහ වහා එම මාධ්‍යය ප්‍රගුණ කිරීමට මහන්සි වීමය. මාධ්‍යය ඉංග්‍රීසි වූ පමණට භාෂාවක් සපුරා දියුණු නොවන්නේය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගණිතය හෝ විද්‍යාව හෝ වෛද්‍ය විද්‍යාව හෝ වෙනත් විද්‍යාවක් හැද ෑරෑ පමණට මහත් භාෂාභිවෘද්ධියක් ඇති නොවන්නේය. අදාළ විෂය ක්ෂේත්‍රයට වැදගත් වන භාෂාව පෝෂණය වීම සැබෑවකි. එහෙයින් එයින් ම සෑහීමට පත් විය නොහැකිය. ඉංග්‍රීසියෙන් උගෙන ගන්නා අතර ලහි ලහියේ ඉංග්‍රීසි භාෂා දැනුම හා පරිචය වර්ධනය කර ගත යුතුය. ඉතාම දුර්වල ඉංග්‍රීසි දැනුමක් සහිත අය දිවා රෑ නොබලා පූර්ණ ලෙස නිමග්න වී ඉංග්‍රීසිය ප්‍රමාණවත් තරමින් දියුණු කර ගත යුතුය. එහිදී ඉංග්‍රීසි භාෂාව විශ්ව විද්‍යාලයේ දී හැදෑරීමට පසුබට නොවිය යුතුය. ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලබන අතර තුර ඉංග්‍රීසි පංතිවලට සහභාගී වීම කෙනෙකුට ලජ්ජාවට කරුණක් විය හැකිය. සමහරෙක් හෙළා දැකිය හැකිය. "ඉංග්‍රීසි පුළුවන් කියල ගියාට ඔන්න මුල ඉඳල ඉගෙන ගන්න සිදු වුණා" වැනි වාග් ප්‍රහාර එල්ලවන්නට පුළුවන. එවැනි ප්‍රහාර එල්ල කරනුයේ අනුන් ඉංග්‍රීසියෙන් ඉගෙන ගැනීම



නොරුස්සන අයය. රුස්සන්නෝ අගයති, අත දෙති. මෙහිදී වැදගත් වන්නේ නොසැලී ඉදිරියටම යෑමය. ඉංග්‍රීසි දුර්වල අයට හිටි හැටියේම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාවක් හැදෑරීම දුෂ්කර වන්නටද, එම දුෂ්කරතාව විසින් චෛතසික පීඩනයක් ඇති කිරීමට ද පුළුවන. එහෙත් පසුබපට නොවිය යුත්තේ එම දුෂ්කරතාව ක්‍රමයෙන් පහව යන හෙයිනි. භාෂා ඥානය දිනෙන් දින දියුණුවන විට දුෂ්කරතා ඒ අනුපාතයට අඩු වී යන්නේය.

## 9 පරිගණක තාක්ෂණ දැනුම දියුණු කිරීම

සරසවියේ පවත්නා සම්පත් අතර තොරතුරු තාක්ෂණයට අදාළ සම්පත් කොතෙක් දුරට ප්‍රගතිගාමී ලෙස භාවිත වන්නේ ද යන්න විමසිය යුත්තකි. සිසුන්ට නොමිලයේ ම පරිගණක භාවිත කළ හැක්කේ සරසවියේ දී පමණි. එසේම එම ක්ෂේත්‍රයේ පුහුණුවද නොමිලේය ම ලැබෙන්නේය. පරිගණක සහසුකම් දියුණු කිරීමට රජයෙන් ද කෙරෙන යෝජනා ඇත්තේය. නව පරම්පරාව තොරතුරු තාක්ෂණ දැනුමෙන් හා කුසලතාවෙන් පරිපූර්ණ වීම රටට වාසි රාශියක් ගෙන දෙන්නේය.

පෞද්ගලික අංශයේ හෝ වේවා රාජ්‍ය අංශයේ හෝ වේවා පරිගණක භාවිතයේ සීමාවක් නැත්තේය. නවක උපාධිධාරීන්ට රැකියා ලබා ගැනීමේදී මෙම පරිගණක සුදුසුකම බලපාන්නේය. අද ලංකාවේ පරිගණක භාවිත වන ස්ථාන වැඩිවෙමින් පවතින අතර උපාධි අපේක්ෂකයන් ඊට සූදානම් විය යුතුය.

## 10 අන්තර්ජාලය පරිශීලනය කිරීම

අන්තර්ජාලය දනටමත් සිසුන් යම් පිරිසක් භාවිත කරන අතර තවත් පිරිසක් අන්තර්ජාලය නොබලති. අන්තර්ජාලයේ ඇති සියලු දේ නිවැරදි නොවන්නේය. වඩා වැදගත් වන්නේ විශ්වාසය වඩාත් තහවුරු වන තොරතුරු පමණක් අන්තර්ජාලයෙන් ලබා ගැනීමය. රට රටවල තොරතුරු දන ගැනීමට පමණක්ම නොව සමාජ සම්බන්ධතා සඳහා ද අන්තර්ජාලය වැදගත් වන්නේය. සියලු දෙනාම විද්යුත් සන්දේශනයෙහි යෙදිය යුතුය. ඒ සඳහා ලිපිනයක් ලබා ගත යුතුය.

## 11 සම්මන්ත්‍රණ, සංවාද ආදියට සහභාගි වීම

සරසවි සිසුන් තුළ අසීමිත ශාස්ත්‍රාලයක්, ශාස්ත්‍රොත්ග්‍රහණ අභිප්‍රේරණයක් පැවතිය යුතුය. සරසවියේදී එය වර්ධනය කරගනු මැනවි. එසේ අභිප්‍රේරණය වූ සිසුන් දුලබ හෙයින් බොහෝ ශාස්ත්‍රීය සංවාද, සාකච්ඡා, සම්මන්ත්‍රණ හා විශේෂ දේශනවලට සහභාගී වනුයේ අතලොස්සකි. විශ්වවිද්‍යාලයෙන් බැහැරව පවත්වනු ලබන ශාස්ත්‍රීය වැදගත්කමකින් යුත් සම්මන්ත්‍රණ, දේශන ආදියට හැකි උපරිම අයුරින් සහභාගී විය යුතුය. දනුම දියුණු කර ගැනීමට උනන්දුවක් නැති හෙයින් බොහෝ දෙනෙක් ශාස්ත්‍රීය සංවාද, දේශන, සම්මන්ත්‍රන ආදියට සහභාගි වී ප්‍රයෝජනයක් නොගනිති. වර්තමානයේ විවිධ ත්‍රස්තවාදි තර්ජන පවතින හෙයින් දනුම සෙවීම සඳහා කොළඹ ගැවසීම යහපත් නොවේ. ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වෙමින් සංවාද, සම්මන්ත්‍රණ ආදියට උපරිම මට්ටමෙන් සහභාගී විය යුතුය. විවිධ



විද්‍යාර්ථීන් හඳුනා ගැනීමට ද සම්බන්ධතා ගොඩ නගා ගැනීමට ද සරසවි ජීවිතය අර්ථවත් වීමට ද ඥාන ගවේෂණයෙහි නිරන්තරයෙන්ම යෙදීම අත්‍යවශ්‍ය වන්නේය. එවැනි දෑ සංවිධානය කොට සරසවියේම පැවැත්වීම මගින් ගමන් ගාස්තු පිරිවැයක් නැතිව අවශ්‍යතා ඉටුකර ගත හැකිය. ඉගෙන ගන්නා කාලයේදී එවැනි සම්මන්ත්‍රණ ආදියට සහභාගී වී පුරුද්දක් ඇතිකර නොගත හොත් යළි ඇති වීමට තිබෙන ඉඩකඩ ඉතා අඩුය. දනුම සෙවීම සරසවියෙන් ඔබ්බට පැතිරවීම මෙහිදී අවධාරණය කළ යුත්තකි. කොළඹ දිස්ත්‍රික්කයේ පවත්නා සරසවියකට එන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සෙසු පළාත්වල සරසවිවල සිසුන්ට ලැබෙන ඉඩ ප්‍රස්තා හා වාසිවලට වඩා වැඩි ප්‍රමාණයක් ලැබෙන්නේය. බොහෝ දෑ පවතින්නේ ද පවත්වනුයේ ද කොළඹය. ඉදින් කොළඹ යම් කාලයක් ඉදත් එයින් ප්‍රයෝජනයක් තමාගේ ඥානාභිවර්ධනයට නොලැබෙන්නේ නම් එය අභාග්‍යයක්ම වන්නේය. සරසවි සම්පත්වලින් පමණක් නොව කොළඹ පවත්නා සම්පත්වලින් ද ප්‍රයෝජනයක් තමාගේ අනාගතාභිවෘද්ධිය සඳහා ලබා ගැනීමට තරම් කාර්යශූර විය යුතුය.

## 12 කාලාත්මක, සෞන්දර්යාත්මක වින්දනය

සරසවි ශිෂ්‍ය ශිෂ්‍යාවන් බුද්ධිමතුන් වන්නා සේම කලාවට සංවේදී පුද්ගලයන් විය යුතුය. තමා කවර විෂයක් හැදෑරුව ද කම් නැත. ස්වකීය වින්දනය සඳහා යම් වින්දනාත්මක කටයුත්තක යෙදිය යුතුය. සංගීතය, නර්තනය, චිත්‍ර කලාව, නාට්‍ය ආදී විවිධ අංශවලින් තමන්ට ගැළපෙන අංශයක් තෝරා ප්‍රගුණ කිරීමෙන් වින්දනය ලැබෙන්නේය. චෛතසික පීඩාකාරී තත්ත්වයන් පහව යන්නේය. ඉවසීමේ

ගුණාංගය වර්ධනය කරන්නාවූත්, සංවේදීභාවය තියුණු කරන්නා වූත්, සුන්දර අත්දැකීමක් වන්නාවූත්, සංස්කෘතියට සදාචාරයට එකඟ වූත් වින්දන මාධ්‍යක් දියුණු කර ගැනීම මෙහිදී වැදගත් වන්නේය.

අසංවේදීභාවය නිසා සරසවි සිසුහු සරසවිය භුක්ති නොවිඳිති. අපේ සරසවියේ පරිසරය ඉතා අලංකාරය. අප්‍රේල් මාසයේ මුලදී රෙබරෝසියා මල් පිපෙන්නේ ය. ඒ මල ඉතා අලංකාර දර්ශනයක් මවන්නේය. රෝස පැහැයෙන් යුත් එම මනස්කාන්ත පාරිසරික සෞන්දර්යය කීයෙන් කීදෙනෙක් දැක භුක්ති වින්දේ ද යන්න සැකයකි. එසේම මැයි මාසයට සරසවියේ යම් යම් ස්ථාන රක්ත වර්ණයෙන් බැබළේ. ඒ මැයි මල් පිපීමත් සමගය. ඇසළ මහට කහ පාටින් විදුදය සැරසෙන්නේය. ඇසළ ගස් පුරා පිපී ගිය මලෙන් කොතරම් සරසවිය රමණීය වුවත් එම දර්ශනයේ සතුට භුක්ති විඳි පිරිසක් සිටී දැයි කිව නොහැකිය. සැබැවින් ම මෙවැනි මල් දෙස ඇසිපිය නොහෙළා බලා සිටිය යුතුය. එසේ කිරීමෙන් ඒ මලේ අසිරියට සංවේදී වන්නේය. එයින් සිත සුපහන් වන්නේය. කාව්‍ය සංකල්පනා පහළ වන්නේය. විවිධ නිර්මාණ සිත් තුළ පහළ වන්නේය. සරසවි ජීවිතය අර්ථවත් වන්නේය. එම පරිසරයෙන් හා මල්වලින් සෙතක් වනුයේ අප ඒවා ගැන සවිඥානක වන තරමටය. සංවේදී වන තරමටය. වින්දනය කරන ප්‍රමාණයටය. ඒවා දැක දැකත් නොදුටුවා සේ යන කලට අගනා තෘප්ති මූලාශ්‍රයක් අහිමි වන්නේය. පරිසරය වින්දනය කිරීමට පුරුදු නොවුවහොත් එය අභාග්‍යයකි. එබැවින් සරසවි සිසුන් තම සරසවි පරිසරයට, එහි සෞන්දර්යයට ආසක්ත විය යුතුය.



සරසවියේ සිටින කාලයේ දී සංස්කෘතික මධ්‍යස්ථානයෙන් හෝ වෙනත් අංශයකින් ගායනයට, වාදනයට හෝ වෙනත් වින්දනාත්මක කටයුත්තකට පුහුණු වීම සරසවි ජීවිතයට පමණක් නොව සිය ජීවිතය පුරාවට ම වැදගත් වන්නේය. යම් සංගීත භාණ්ඩයක් වාදනය කිරීමට පුරුදු වුවහොත් ස්වකීය ගෘහස්ත ජීවිතයට එයින් අර්ථයක් එක් කරනු ඇත. විවේකය ගත කිරීමට මෙන්ම මානසික තුලනාත්මකභාවය පත්වාගෙන යැමට උපකාරී වනු ඇත. පවුල් ජීවිතයේ සාර්ථකත්වයට ද එයින් පිටිවහලක් ලැබෙයි. එබැවින් වෛද්‍යවරුන් වන අයද, කළමනාකරුවන් වන අයද, වෙනත් විවිධ ක්ෂේත්‍රවල වෘත්තිකයන් වන අයද විෂය භේදයෙන් විනිර්මුක්තව යම් කලා මාධ්‍යයකට යොමු විය යුතුය. එය පෞරුෂයේ කිසියම් වැදගත් හිස්තැනක් පුරවා ජීවිතය සැපවත් කරනු ඇතැයි විශ්වාස කරමි.

## 13 ක්‍රීඩාවක නිරතත වීම

සරසවි සම්පත් උපරිම ලෙස ශිෂ්‍ය අභිවෘද්ධිය සඳහා භාවිත නොකිරීම අතින් ක්‍රීඩා සම්පත් මතු වී පෙනේ. ක්‍රීඩාගාරද, ක්‍රීඩා උපකරණ ද, ක්‍රීඩා පිටි ද වෙනත් ක්‍රීඩා පහසුකම් ද සුලභව පවතින නමුත් අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ඒවායෙන් උපරිම ප්‍රයෝජන නොගනිති. පාසල් සමයේ පටන් ක්‍රීඩාවට ඇල්මක් ඇති අය සරසවියේ දී ද ක්‍රීඩාවට යොමුවන අතර අභිනවයෙන් ක්‍රීඩාවට යොමුවන්නේ සුළු පිරිසකි. ක්‍රීඩාවක යෙදීය යුත්තේ ජයග්‍රහණ ලැබීමට ම නොවන්නේය. ක්‍රීඩාවක යෙදීම ම තෘප්ති ජනක දෙයක් වන අතර කායික වර්ධනය හා නීරෝගීභාවයට ද යහපත් මානසික සෞඛ්‍යයට ද හේතු වන්නේය. විශාල ධනස්කන්ධයක් ආයෝජනය කොට ලබා දී

ඇති ක්‍රීඩා පහසුකම් හා ඉඩ ප්‍රස්තා භුක්ති නොවිඳීම ද අභාග්‍යයකි. අපේ අය නිතරම පුරුදු වී ඇත්තේ නැතිදේ ගැනම කතා කිරීමට හා උද්ඝෝෂණ කිරීමටය. විවේචන ඉදිරිපත් කිරීමටය. එහෙත් ඇති දේ ප්‍රයෝජනයට ගැනීමට උනන්දු නොවෙති. ලබා ගත් දේ හෝ ලැබී තිබෙන දේ නිසි ලෙස පරිහරණය නොකොට නැති දෙයක් ගැන වෙහෙසීමෙන් ඵලක් නොවන්නේය. ජීවිතයක් තෘප්තිමත් වන්නේත් අර්ථවත් වන්නේත් පළමුව පවත්නා දේ භුක්ති විඳීමෙන්ය. පවතින ක්‍රීඩා පිටියෙන් උපරිම ප්‍රයෝජනය ගන්නා අතර අලුත් පිටියක් හෝ හොඳ පිටියක් ගැන කතා කළ යුතුය. සියල්ල කිසිදා සම්පූර්ණ නොවන්නේය. එසේම පහසුකම් ද දිනෙන් දින ප්‍රගමනය වේ. එනිසා දියුණුවේ සීමාවන් ද නැත්තේය. පවත්නා අවම සම්පතින් හෝ ප්‍රයෝජන ගන්නා පරිදි කටයුතු කිරීම ප්‍රධාන පිළිවෙත විය යුතුය. එහිදී ඉල්ලීම් ලබා ගැනීමට සිසුන් සංවිධානය කොට පෙළ ගස්වන්නා සේම පවත්නා සම්පත් භුක්ති විඳීමට ද පරිහරණය කිරීමට ද මහත් උද්‍යෝගයෙන් සිසුන් සංවිධානය කොට පෙළගැස්විය යුතුය. එසේ කළහොත් ක්‍රීඩා පිටි පාළුවට නොයනු ඇත. ක්‍රීඩා භාණ්ඩ අභාවිතව නොපවතිනු ඇත. ශරීරය හා මනස සෞඛ්‍ය සම්පන්න වනු ඇත. තරුණ ජවය මැනවින් උද්දීපනය වනු ඇත. දේශනවලදී පවත්නා මළානික හා කුසීත මන්දගාමී ගති පැවතුම් තුරන් වී සක්‍රිය ශිෂ්‍ය ප්‍රජාවක් සරසවියේ සංවිධානය වනු ඇතැයි අපේක්ෂා කරමි. ඒ සඳහා සිසුන් සියලු දෙනාම නිකරුණේ කතා කිරීමෙන් හෝ දේශන නැතැයි කියා ගෙදරට හෝ බෝඩිමට හෝ කොන් වී නොසිට, සරසවියට පැමිණ යම් ක්‍රීඩාවක නිරත විය යුතුය. එවැනි පුරුද්දක් ඇති කර ගත මනාය. සියල්ල මුදලට ලබා ගන්නා



සමාජාර්ථික රටාවක් තුළ මෙසේ නොමිලයේ ලැබෙන සම්පත් හා සේවා පරිහරණය කොට ස්වයං සංවර්ධනයක් ඇතිකර නොගන්නේ නම් එය සරසවි සිසුන්ට තරම් නොවන්නේය.

## 14 සරසවි ශිෂ්‍යාභිමානය

අප සරසවියට පැමිණෙන සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම සරසවිය පිළිබඳව අභිමානවත් හැඟීමක් දැරිය යුතුය. ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, විශ්ව විද්‍යාල අතර තවත් එක් විශ්ව විද්‍යාලයක් පමණක් ම නොවන්නේය. එයට විශේෂ අනන්‍යතාවක් ඉතිහාසයක් ඇත්තේය. ඒ අනන්‍යතාවය බෙදා හදා ගැනීමට හා එයින් අභිමානයක් ගොඩ නගා ගැනීමට බාධාවක් නැත්තේය. බෞද්ධ මහ පිරිවෙනක විකාශනයෙන් ඇති වූවකි, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයය. එම පිරිවෙන විද්‍යෝදය පිරිවෙන නම් විය. ආදි කර්තෘවරයාණෝ කීර්තිමත් පඬිවරයෙකු වන හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමියෝය. උන්වහන්සේගේ ප්‍රතිමාවක් විශ්වවිද්‍යාලයට ප්‍රවේශ වන විටම දෘශ්‍යමාන වේ. එහි ඉතිහාස ප්‍රවෘත්තිය සඳහන් වන්නේ උන්වහන්සේගේ අභිධානය සමඟය. "විද්‍යෝදය පරිවෙනස්සාදිකත්තා හික්කඩු නාම ගාමජො සිරි සුමංගල තෙරො" යන වදන සිසුන් කාටත් මතක තිබිය යුත්තකි. එය අභිමානයේ මූලයයි. ඊළඟට වැලිවිටියේ සෝරත නාහිමියන්ගේ ප්‍රතිමාව විද්‍යමාන වේ. ප්‍රථම විශ්වවිද්‍යාලධිපති වූයේ උන්වහන්සේය. උන්වහන්සේ ද ශ්‍රී සුමංගල හිමියන් සේම මහ පඬිවරයාණ කෙනෙකි. ශ්‍රී ලංකාවේ ශාස්ත්‍රාම්බරය ඒකාලෝක කළ මහ පඬිවරු වෙති. මේ ලිපියේ උන්වහන්සේලා ගැන වදනක් සඳහන් කළේ අභිප්‍රේරණයක් වශයෙනි.

මෙයින් අභිප්‍රේරණයක් ලබා තමාගේ විශ්වවිද්‍යාලයේ ඉතිහාසය සෑම සිසුවෙක්ම කියවා දැනගත යුතුය. මේ ගැන කිසිවෙක් උගන්වන තෙක් බලා නොසිටිය යුතුය. සෑම පීඨයකටම සිසුන්ට විශ්වවිද්‍යාල ඉතිහාසය පිළිබඳ දැනුම පොදුවේ වැදගත්වේ. ආගම් භේදයක් හෝ ජාතිභේදයක හෝ පීඨ භේදයක් නැත්තේය. තමා ඉගෙන ගන්නා සෙවණේ ඉතිහාසය කියවා බලා එහි සිටි පඬිවරු ද ඔවුන්ගේ ශාස්ත්‍රොන්නතිකාමී කෘත්‍යයන් ද දැන හඳුනා ගැනීමෙන් තම සරසවි අනන්‍යතාව ගැඹුරු අභිමානයත් එකක් වන අතර පෞරුෂත්වය එඩිතර වන්නේය. නිකම් ම නිකමෙක් ලෙස කිසිවක් නොදැන උපාධි ලියවිල්ලක් රැගෙන සරසවියෙන් බැහැර වීමේ ඇති ඵලය කුමක් ද. සරසවියෙන් බැහැරට යා යුත්තේ හරබර පෞරුෂත්වයක් සහිත උපාධිධරයෙකු ලෙස ය. එම හරබර ලැබෙනුයේ අධ්‍යාපනය සාර්ථකව නිම කිරීමත්, උගත් ස්ථානය හා අනන්‍ය වීමත් යන කරුණු දෙකේ සංකලනයෙන් ය. ඒ සංකලනයෙන් වගකීමක්, අනාගත දැක්මක්, ගැඹුරක්, සාධාරණ ආඩම්බරයක් හා විද්‍යාර්ථී නිහතමානීභාවයක් ද සහිත පුද්ගලයෙකු විය හැකිය. සරසවි ශිෂ්‍ය පෞරුෂය පාවී යන්නක් නොවන්නේය. එය පුද්ගලයා දෙපයින් උපන් බිමේ පිහිටුවනු ලබන්නකි. අල්ලක් පල්ලක් නැති සංස්කෘතික අනාථයෙක් ද බවට පත් නොකරන්නකි. මෙරට සමාජයේ සංස්කෘතියේ අනන්‍ය ලක්ෂණවල පිහිටා මහපොළවේ දෙපයින් සිටගත නොහැකි නම්, ජනතාවගේ හද ගැස්ම හඳුනාගත නොහැකි නම්, රටට ආදරයක් නැත්නම් එම ජීවිතවලට අර්ථයක් ලැබෙන මූලාශ්‍රයක් නැතිව යන්නේය. ජීවිතයට අවසාන වශයෙන් අර්ථයක් ලැබෙනුයේ උපන් බිමේ, උගත් ස්ථානයේ, හැදුණු වැඩුණු පරිසරයේ



අභාසයෙන්ය. ඒ තැන්වලට ආදරය කළ යුතුය. සරසවි ශිෂ්‍යා අප විශ්වවිද්‍යාලයේ ඉතිහාසය කියවා, තේරුම් ගෙන, එහි පඬිවරු දැන හඳුනාගෙන ජීවිතය අර්ථවත් කර ගත යුතුය. හුදු අනුකාරයෙකු ලෙස නොව නිර්මාණශීලී පුද්ගලයෙක් විය යුතුය. ඊට අවශ්‍ය තරම් පාඩම් සරසවි ඉතිහාසයෙන් උගත හැකිය. අවශ්‍ය වන්නේ ඒ සඳහා කාලය මිඩංගු කර කැපවීමය.

## 15 සරසවියේ විවිධ අංශවලින් ප්‍රයෝජන ගැනීම

සරසවියේ පවත්නා විවිධ සේවා හඳුනා ගැනීම හා ප්‍රයෝජන ගැනීම අවධාරණය කළ යුතු තවත් කරුණකි. සරසවි ජීවිතය මෙන්ම අනාගත වෘත්තිය ජීවිතයට උපකාරවන සේවා සලසන අංශ විශ්වවිද්‍යාලය තුළ පවතී. සිසුන් ඒවා ගැන සැලකිලිමත් විය යුතුය. එසේම විවිධ බාහිර සේවාවන් පිළිබඳවද විස්තර ලැබේ. ඒවා දැන්වීම් පුවරුවල පළ වේ. දැන්වීම් පුවරුවල පළවන විවිධ දැන්වීම් කියවිය යුතු අතර එමගින් ප්‍රයෝජනයට ගත හැකි සම්පත් වෙත යා යුතුය. අපේ සිසුන්ගේ එක් ඌනතාවක් වන්නේ වාචිකව යමක් සන්නිවේදනය කරන තුරු සිටීම. එසේ නැත්නම් ආරංචියක් ලැබෙන තෙක් සිටීම. සරසවි ශිෂ්‍යයා ආරංචි සොයා යන්නෙකු විය යුතුය. විවිධ මූලාශ්‍රයෙන් තොරතුරු සපයා ගෙන තම ජීවිතය හා අධ්‍යාපනය සාර්ථක කර ගැනීමට වෙහසිය යුතුය.

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය අප විශ්වවිද්‍යාලයේ වැදගත් අංශයකි. එමගින් අනාගත වෘත්තිය ජීවියට අදාළ සේවාවන් රාශියක් සැපයේ.

පෞරුෂත්ව වර්ධන පාඨමාලා හා ක්‍රියාකාරකම් ද වැඩ මුළු ආදිය ද සංවිධානය කෙරේ. ඊකියාවලට හඳුන්වා දීමටද, ආයතන සමඟ සම්බන්ධතා ගොඩ නැගීමට ද, ඊකියා ඉඩ ප්‍රස්තා වැඩිවැඩියෙන් සරසවි සිසුන්ට ලබා දීමට ද කටයුතු කෙරේ. කොතරම් ප්‍රචාරය කළ ද තවමත් මෙම අංශයට පැමිණ උනන්දුවෙන් සේවය ලබා ගනුයේ සීමිත පිරිසකි. ඒ අනාගත අභියෝගය පිළිබඳ අවතක්සේරුව ද හේතු කොටගෙනය. අනාගත ජීවන අභියෝගය හොඳින් හඳුනාගත් ශිෂ්‍යයෝ පැමිණෙති. එහි සේවය ලබා ඊට මුහුණ දීමට සන්නද්ධ වෙති. අනෙකුත් සිසුන් ද ඔවුන් අනුගමනය කළ මනාය.

## 16 විශ්වවිද්‍යාලය පිළිබඳ දැනුම

සරසවියට ප්‍රවේශ වන සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම සරසවියේ ඉතිහාසය මෙන්ම වර්තමාන ස්වභාවය, සංවිධානය, පරිපාලනය කාර්ය මණ්ඩලය හා තමාගේ ශිෂ්‍යභාවය පිළිබඳ දැන ගත යුතුය. බොහෝ දෙනෙකුට එම දැනුම වසර කීපයක් ගත වුවද නොතිබේ. ඊට හේතුව ඔවුන්ගේ නොසැලකිල්ලය. මේ නොසැලකිල්ල නිසා අපහසුතාවයට පත්වන අවස්ථා තිබෙන අතර අවාසි ද සිදුවන්නේය. පසුගිය දිනක සරසවියෙන් විශ්‍රාම ගන්නා මහාචාර්යවරයෙකුට උපහාර දැක්වීමේ උළෙලක් පැවැත්විණි. එහිදී ඔහුගේ ආදරණීය ශිෂ්‍ය ශිෂ්‍යයාවෝ සමරු පළකයක් ද පිළිගැන්වූහ. "ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මහාචාර්ය" යනුවෙන් අදාළ මහාචාර්යවරයාගේ නමට මුලින් එහි සඳහන්ව තිබුණි විශ්වවිද්‍යාලයේ තනතුරු හා ඒවායේ ධුරාවලිය හා ජ්‍යෙෂ්ඨත්වය පිළිබඳව සිසුන්ගේ අනවබෝධය ඉහත සමරු පළකයෙන් පෙනී යයි. මෙය එක් ශිෂ්‍ය



පිරිසකට සීමා වූවක් නොවේ. සිසුන් බොහෝ දෙනෙකුට විශ්වවිද්‍යාලය හා එහි කාර්ය මණ්ඩලය ආචාර්ය මණ්ඩලය පිළිබඳ අවබෝධයක් නැත්තේය.

විෂය ඒකක ක්‍රමය හඳුන්වා දීමත් සමඟ කලින් අවුරුද්දක් පුරා ඉගැන්වූ විෂයන් වෙනුවට අර්ධ වාර්ෂිකයක් තුළ උගන්වා අවසන් කරනු ලබන විෂය ඒකක පැමිණියේය. සාමාන්‍යයෙන් එක් විෂය ඒකකයක කාලය පැය හතළිස් පහක් පමණය. එයින් පැය පහළොවක් නිබන්ධන පංති, ප්‍රායෝගික කටයුතු ආදිය සඳහාය. සිසුන් ආචාර්යවරුන් හමුවන කාලය මේ නව ක්‍රමය අනුව සීමා සහිත වූ අතර විෂය ඒකක දහයක් වසරක් තුළඑ සම්පූර්ණ කිරීම සඳහා ආචාර්යවරුන් දහදෙනෙකුගේ දේශනවලට (ශාස්ත්‍ර පීඨයේ) සහභාගී වීමට සිදුව තිබේ. මෙම පරිසරය තුළ දූන් දූන් සිසුන්ට තමන්ගේ විෂයන් උගන්වන ආචාර්යවරුන් පිළිබඳව ද අවබෝධයක් නැති තරම්ය. මේ කරුණ අපට දැනගත හැකි වූයේ පැවරුම් භාර දීම සඳහා අධ්‍යයනාංශයට පැමිණ අදාල ආචාර්යවරයා හෝ ආචාර්යවරිය සොයන සිසුන් ආශ්‍රයෙන්ය ඔවුහු ආචාර්යවරයා හෝ ආචාර්යවරිගේ නම හොඳින් මතක නැතිව නම වරද්දා කියමින් විපරම් කරති. නැත්නම් යම් දේහ ලක්‍ෂණයක් ඉදිරිපත් කරමින් නම නොදන්නාකම අඟවති. මේ තත්ත්වය ඇති වූයේ මෑතක සිටය. දැනට වසර පහකට දහයකට පෙර තත්ත්වය ඉඳුරාම වෙනස් විය. එකලත සිසුහු තම ගුරුවරයා හොඳින් හැඳින සිටියහ. සම්බන්ධතා ද පැවැත්වූහ. ව්‍යාකූලත්වයක් නොතිබුණි.

එහෙත් අද තත්ත්වය පුදුම සහගතය. උපාධිය සඳහා විෂය ඒකක එකතු කිරීම හැර වෙනත් කිසිවක් නොදන්නා තරම්ය. සමහර ශිෂ්‍යයෝ ආචාර්යවරුන්

හමු වී පසුගිය වාරයේ හෝ වර්ෂයේ පැවරුම් ඉල්ලති. පැවරුමක් පසුගිය වාරයේ හෝ වර්ෂයේ නොදුන් බව හා ඒ වෙනුවට මධ්‍ය වාර පරීක්ෂණයක් පැවැත් වූ බව මතක නැද්දැයි විමසූ විට තුෂ්ණිම්භූත වී යති. කවර විෂයකට පැවරුම් ලීවේද, කරවර විෂයකට මධ්‍යවාර පරීක්ෂණ පැවැත්වූයේ ද යන්න පිළිබඳ ඔවුන්ට මතකයක් නැත. එතරම් ම ව්‍යාකූලත්වයක් පවතී. එසේ වන්නේ සිසුන් ගුරුවරුන් සමඟ පවත්වන සම්බන්ධතා දුර්වල වීම හේතුවෙන්ය.

## 17 ගුරු ශිෂ්‍ය සබඳතා

විශ්වවිද්‍යාලයේ සිටීම හා දේශනවලට සහභාගී වීම ම ප්‍රමාණවත් නොවන බව මෙහිදී උපදේශයක් වශයෙන් සඳහන් කළ යුතුව පවතී. ආචාර්යවරුන් හමු වීමට දැන හඳුනා ගැනීමට ද සම්බන්ධතා ගොඩ නගා ගැනීමට ද උනන්දු විය යුතුය. එම සම්බන්ධතාව පෞරුෂ වර්ධනයට මහෝපකාරී වන්නේය. එසේම සාර්ථක අධ්‍යාපනයක් සඳහා අවශ්‍ය මග පෙන්වීම ද එමගින් ලැබෙන්නේය. බොහෝ ආචාර්යවරු සරසවියේ රැඳී සිටින අතර ශිෂ්‍ය උන්නතිය වෙනුවෙන් කැප වී සිටිති. ඔවුන්ගෙන් ප්‍රයෝජන ගැනීමට සිසුන් තුළ උනන්දුවක් පැවතිය යුතුය. අධ්‍යයන වර්ෂ ආරම්භයේ දී, නවක සිසුස් ඇතුළත් කර ගනු ලබන අවස්ථාවේ දී හා පංති ආරම්භ කරන අවස්ථාවලදී මේ කරුණු අවධාරණය කෙරේ. තමන්ට තිබෙන ගැටලු ආචාර්යවරුන් සමඟ සාකච්ඡා කරන ලෙසට දැනුම්වත් කෙරේ. එහෙත් කිසියම් බලවේගයක් විසින් දෝ සිසුන් ආචාර්යවරුන් හමුවීම වළක්වනු ලබන බවක් පෙනී යන්නේය.



සරසවි ශිෂ්‍යයන් ස්වාධීන විය යුතුය. අනුන්ගේ බහට නොව තමන්ගේ බහට අනුව කටයුතු කළ මනාය. සරසවිය ගැනත් නොදැන, ආචාර්යරුන් ගැනත් නොදැන උපාධි ලබා ගැනීමේ ඇති ඵලය කුමක්ද? කවුරුන් විසින් හෝ උගන්වනු ලබන තෙක් බලා නොසිට විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හඳුනා ගත යුතුය. ඔවුන්ගේ තනතුරු නාම පැහැදිලිව දැන ගැනීමටත් කාර්යභාර අවබෝධ කර ගැනීමටත් උනන්දු විය යුතුය. ආචාර්ය මණ්ඩලයක ඉහළම තනතුර ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුරයයි. ඊළඟට සෑම අධ්‍යානාංශයකටම මහාචාර්ය නිළධූරයක් තිබේ. එය අධ්‍යයනාංශයේ මහාචාර්යාසනයයි. ඊට සුදුසු කෙනෙකු තෝරා පත්කරනු ලැබේ. ඒ හැරුණු විට උසස්වීම් ලබා මහාචාර්යධුරයට පත් වූ ආචාර්යවරු ද සහාය මහාචාර්යවරුද සිටිති. ධුරාවලියේ ඊළඟ ස්තරයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය පළමු ශ්‍රේණිය ද ඊළඟ ස්තරයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර් දෙවන ශ්‍රේණියේ කථිකාචාර්යවරුද සිටිති. ඊළඟට අනුපිළිවෙලින් ස්ථිර කථිකාචාර්යවරු ද ආධුනික කථිකාචාර්යවරු ද, උපදේශකවරු ද ප්‍රදර්ශකවරු ද සිටිති. තමාගේ ගුරුවරයා නමින් හා තනතුරෙන් හඳුනා නොගැනීම අඩුවකි. පළමුව තමා යම් විෂයක් හදාරන අංශයේ මහාචාර්යවරයා හෝ මහාචාර්යවරිය කවුද යන්න දැනගත යුතුය. දෙවනුව තමාට උගන්වන ගුරුවරු ද ඔවුන්ගේ තනතුරු හා පොත පත ආදිය ගැනද ඉගෙන ගත යුතුය. එසේම එම අංශයේ අනෙකුත් ප්‍රසිද්ධ අප්‍රසිද්ධ ආචාර්යවරු කවුරුත් ගැන දැන කියා ගත යුතුය. සමහර සිසුහු ආචාර්යවරයෙකු සමඟ කතා නොකරම උපාධි ගෙන ගෙදර යති. ඔවුහු එතරම්ම පසුබට වෙති. අන්තිමට තමාට ඉගැන්වූ ආචාර්යවරුන්ගේ නම්වත් හරියට නොදනිති. සම්මුඛ

පරීක්ෂණ මණ්ඩලවල දී මෙම ගැටලුව මතුවිණි. සම්මුඛ පරීක්ෂකවරුන් සහතික පත්‍රවල ඇතුළත් විෂයයන් ඉගැන්වූයේ කවුරුන්දැයි විමසන අවස්ථාවල දී පිළිතුරක් දීමට අපොහොසත් වූ සිසුන් ගැන එම සම්මුඛ පරීක්ෂකවරුන්ගෙන් ම දැන ගැනීමට ලැබුණි. සමහර අයට විශේෂ උපාධියක් තිබුණ ද, ප්‍රථම හෝ දෙවන ඉහළ පෙළ සාමාර්ථයක් තිබුණ ද අධ්‍යයනාංශයේ මහාචාර්යවරයාගේ නම හෝ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් හතර පස් දෙනෙකුගේ නම් හෝ කියා ගැනීමට බැරි විණි. එතරම්ම අවිඥානකව උපාධිය හැදෑරූ සෙයකි. එය ලජ්ජාවට කරුණක් වන බව අමුතුවෙන් සඳහන් කළ යුතු නොවේ.

## 18 විෂය නාම පිළිබඳ දැනුම

මේ අතර සමහර සිසුන්නට උපාධියට හැදෑරූ විෂයන්වල පූර්ණ නම් ගැන පැහැදිලි අවබෝධයක් නැත. ඔවුන් සම්මුඛ පරීක්ෂවලදී කියා ඇත්තේ යම් විෂයක පූර්ණ නාමයෙන් කොටසක් පමණි. විෂයක් අර්ධ වාර්ෂිකයක් පුරා හදාරනු ලැබේ. අර්ධ වාර්ෂිකයකට ඇත්තේ විෂය ඒකක 5 ක් පමණි. යම් අංශයක විෂය ඒකක එකක් අඩු හෝ වැඩි වීමට පුළුවන. අර්ධ වාර්ෂිකයක් පුරා විෂය පහක් හදාරාත් එම විෂය නාම හරියට මතක නැත්නම් විෂයාවබෝධය ගැන කවර කතාද යන්න කෙනෙකු තුළ ඇතිවන නිගමනයකි. සම්මුඛ පරීක්ෂකයෙකුට එවැන්නක් පසක් වුවහොත් රැකියාවක් සඳහා තෝරාගනු නොලැබීමේ ඉඩකඩ වැඩිය.

මේ අතර සමහර සිසුන්ට විෂය නාමය නිවැරදිව ලිවීමට ද අමාරු වන අවස්ථා හමු වී ඇත. ඔවුහු ආචාර්යවරුන් හමු වී නිවැරදි භාවිතය විපරම්



කරති. තවත් සමහරෙකුට ඉංග්‍රීසි භාෂාවෙන් විෂය නාම දැක්වීම උගහටය. එය ද අඩුවකි. ඉංග්‍රීසි භාෂා දැනුම අවධාරණය කරන යුගයක සිංහල හැදෑරුවත් ඒ යටතේ ද සියලු විෂය ඒකක ඉංග්‍රීසියෙන් ද නිවැරදිව ලිවීමට හා ප්‍රකාශ කිරීමට පුළුවන් විය යුතුය. ඒවා නිරවුල් කරගත යුත්තේ රැකියාවලට සම්මුඛ පරීක්ෂණ කැඳවන අවස්ථාවේ හෝ අයදුම් කරන අවස්ථාවේ නොවේ. අධ්‍යාපනය ලබන අවස්ථාවල දීම අදාළ යෙදුම්වල ඉංග්‍රීසි පද හා භාවිත හඳුනා ගත යුතුය. ඉංග්‍රීසියෙන් ලියවී ඇති පොතපත කියවන සිසුන්ට මෙය එතරම් ගැටලුවක් නොවේ. මන්ද, අදාළ සංකල්ප ආදියේ ඉංග්‍රීසි ව්‍යවහාර පොතපතින් නිතර හමුවන බැවිනි. සිංහල භාෂාව පමණක් පරිහරණය කරන අයට ඉංග්‍රීසි පද ගැන අවබෝධය ඉතා අඩුය. ඒ නිසා ඔවුන් කළ යුත්තේ තම විෂය හා අදාළ පාරිභාෂික ශබ්ද නිතර නිතර කඩදාසියක ලියා හෝ පුරුදු පුහුණු කර ගැනීමය.

සමහර සිසුන් කොපමණ නොසැලකිලිමත් දැයි කිවහොත් උපාධිය සඳහා අවශ්‍ය ඒකක ප්‍රමාණය නිසි ලෙස නිසි කලට සම්පූර්ණ කිරීමට අසමත් වෙති. ඊට පිළියමක් වශයෙන් එක් අධ්‍යයන වාරයකදී හෝ දෙකකදී සාමාන්‍යයෙන් ගත යුතු විෂය ඒකකවලට අමතරව තවත් ඒකක කීපයක් හදාරති. මෙය පීඩාකාරී තත්ත්වයක් වන්නේය. මුල සිට සැලැස්මකට අනුව විෂය ඒකකවලට ලියා පදිංචි විය යුතු අතර ඒවායේ ප්‍රතිඵල ද තමාම දැන ගත යුතුය. තමාගේ ප්‍රතිඵලවත් තමාම නොබලන සිසුන් සිටින බව ඇසුවහොත් කෙනෙක් මවිතයට පත්වනු ඇත. එහෙත් අනුන් ලවා ප්‍රතිඵල බලවාගෙන ගෙදර සිට වෙනත් කටයුතුවල යෙදී අමාරුවේ වැටෙන අවස්ථා ද ඇත. මිතුරන්

අතින් සිදුවන වැරදි කියවීමක් නිසා අසමත් විෂය ඒකකයක් සමත් ලෙස සිතා අමාරුවේ වැටෙන අවස්ථා තිබේ. එසේම පැවරුම ද මිතුරු මිතුරියන් අත එවා ඒවා අස්ථාන ගත වීමෙන් හෝ අදාළ ආචාර්යවරයාට භාර නොදීමෙන් අමාරුවේ වැටුණු සිද්ධි තිබේ. ප්‍රතිඵල අත්හිට වූ අවස්ථාවලදී ඔවුහු අඬා වැළපෙති. එවිට ප්‍රමාද වැඩිය. එබැවින් අපගේ උපදේශය වන්නේ තමාගේ අධ්‍යාපන කටයුතු තමන්ම කළ යුතු බව හා අනුන්ට නොපැවරිය යුතු බවයි.

## 19 සරසවි පාලනය පිළිබඳ දැනුම

විශ්වවිද්‍යාලයට පැමිණ නොබෝ කලකින් එහි පරිපාලන ව්‍යුහය හා සංවිධානය හඳුනා ගැනීමට අවශ්‍ය වන්නේය. බොහෝ සිසුන්ට ඒ පිළිබඳ අවබෝධයක් නොමැති අතර දැන ගැනීමේ උනන්දුවක් ද නොමැත. විශ්වවිද්‍යාලයේ නාමික ප්‍රධානියා වන්නේ කුලපතිවරයාය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපතිධුරය දරනුයේ මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නායක ස්වාමීන් වහන්සේය. කුලපතීන් වහන්සේගේ නම ඇසූ විට සමහරෙක් පිළිතුරු දීමට නොදනිති. බෙල්ලන්විල රාජ මහ විහාරයට ශිෂ්‍යයෝ ආගමික කටයුතු සඳහා යන්නාහ. එම පන්සලේ පෙරහැරද නරඹන්නාහ. ඒ අවට ස්ථානවල නවාතැන් ගෙන සිටින්නාහ. එහෙත් මේ විහාරස්ථානයේ සිටින්නේ අප සරසවියේ කුලපති ස්වාමින් වහන්සේ කියා නොදනිති. සිසුන් එම අවබෝධය ලබා ගැනීමට මෙන්ම අන් සිසුන්ට කියා දීමට ද වග බලා ගත යුතුය.

උප කුලපතිතුමා විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී ප්‍රධානියාය. එතුමා යටතේ ලේඛකාධිකාරීවරයෙක් ද නියෝජ්‍ය ලේඛකාධිකාරීවරු ද පරිපාලන යන්ත්‍රය



මෙහෙයවති. ඒ ඒ පීඨවලට පීඨාධිපතිවරු හත් දෙනෙක් අප විශ්වවිද්‍යාලයේ සිටිති. පීඨයකට අයත් ව අධ්‍යනාංශ රාශියක් ඇති අතර ඒ සෑම අධ්‍යයනාංශයකට ම අංශ ප්‍රධානියෙක් සිටී. එසේම අධ්‍යයනාංශ නොවන අංශවලට ද අධ්‍යක්ෂවරයෙකු හෝ ඒකක ප්‍රධානීහු සිටිති. මේ අවස්ථාවේ ඒ සියල්ල විස්තර කිරීමට අදහස් නොකෙරේ. මෙහිදී සඳහන් කිරීමට අවශ්‍යව ඇත්තේ මූලධර්මයක් පමණි. එනම් විශ්වවිද්‍යාලයේ විවිධ අංශ, අංශ ප්‍රධානවරුන් හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ගැන යම් අවබෝධයක් ලබා ගැනීමට සිසුන් උනන්දු වීමය. එසේ උනන්දු නොවීම නිසා බොහෝ ගැටලු හා අපහසුතා මතු වන්නේය. සමහරු තම විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාවත් නොහඳුනති. නම හොඳින් නොදනිති. තනතුර හෝ ප්‍රකට තත්ත්වය නොහඳුනති. සිසුන් විසින් සංවිධානය කොට පවත්වනු ලබන රැස්වීම්, උත්සව ආදියේ දී මේ අනවබෝධය ප්‍රකට වන්නේය. ඒ රැස්වීම් ආදියේ දී උපකුලපතිවරයාගේ හෝ පීඨාධිපතිවරයාගේ හෝ අංශ ප්‍රධානිගේ හෝ නම වැරදියට ව්‍යවහාර කරති. ආචාර්ය, මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ආදි ව්‍යවහාරයන්ද පටලවති. මහාචාර්යවරුන්ට ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය කියා ද, ජ්‍යෙෂ්ඨ නොවන කථිකාචාර්යවරුන්ව මහාචාර්ය කියා ද ඇති තත්ත්ව නැතිවද නැති තත්ත්ව ඇතිව ද ආමන්ත්‍රණය කරන අවස්ථා තිබේ. එසේම ජ්‍යෙෂ්ඨත්වයේ පිළිවෙල නොදන වැදගත් හා ගෞරවණීය අය පහළට වැටෙන සේ ද ඔවුන්ට සාපේක්ෂව පහළ මට්ටමක සිටින අය මුදුන් කොට ආමන්ත්‍රනය කරන අවස්ථාද, පොල්තෙල් පහන් ආදිය දැල්වීමට ආරාධනා කරන අවස්ථා ද තිබේ. නිහතමානී ආචාර්යවරු ඒ ගැන උරණ නොවෙති. සිසුන්ගේ නොදැනුවත්කම ගැන අනුකම්පා

කරති. එහෙත් අප යම් සභාවකට කෙනෙකුට ආරාධනා කළ හොත් ඔහු හෝ ඇයගේ එසේම ස්වාමීන් වහන්සේලාගේ ගෞරවය රැකෙන පරිදි ආමන්ත්‍රණය කිරීමේ, පිළිගැනීමේ ධර්මතාවක් පවතී. එය උල්ලංඝනය කිරීමෙන් අගෞරවයක් ඇතිවේ. සංස්කෘතිය හා හැඳියාව යනු හිතුවක්කාරිව කටයුතු කිරීම නොව සංස්කෘතිය හඳුනාගෙන ඒ අනුව ක්‍රියා කිරීමය. විෂය ඥානය ලබා ගන්නා අතර එකී දේවල් ද සිසුන් දැන කියා ගත යුතුය.

## 20 සරසවි සාමය

විශ්වවිද්‍යාලයේ සාමකාමී ක්‍රියාකාරිත්වය සිසුන්ගේ සැලකිල්ලට ලක්විය යුතු ප්‍රධාන කරුණකි. ලෝකයේ බොහෝ රටවල විශ්වවිද්‍යාල ඉතා සාමකාමීව අධ්‍යයන වර්ෂ සැලසුම් කළ ආකාරයට ම අවසන් කෙරේ. විභාග කලට වේලාවට පැවැත්වේ. එසේම නිවාඩුව ද ඊළඟ අධ්‍යයන වර්ෂය ආරම්භය ද සැලසුම් කළ ආකාරයට සිදුවේ. එහි ප්‍රතිලාභ රාශියකි. ප්‍රථම ප්‍රතිලාභය නම් අතිරේක පිරිවැයකින් තොරව අධ්‍යන වර්ෂයක් අවසන් කිරීම ය. අධ්‍යයන වර්ෂයක් කල් යෑම වූ කලී සම්පත් වැඩිපුර භුක්ති විඳීමකි. එය පිරිවැය වැඩි කරන්නේය. ඊළඟට සිසුන්ගේ අධ්‍යාපනය නිසි කලට අවසන් වී රැකී රක්ෂාවලට හෝ උසස් අධ්‍යාපනයේ ඊළඟ පියවරට යෑමට අවකාශ ලැබේ. ආයු කාලය අනවශ්‍ය විදියට නාස්ති නොවන්නේය. අධ්‍යයන වර්ෂයක් සැලසුම් කළ පරිදි අවසන් කර ගැනීමට හැකි වීම සිසුන්ට පමණක් නොව සිසුන්ගේ පවුල්වලට ද සහනයක් වන්නේය. සරසවි සිසුන් වෙනුවෙන් දෙමව්පිය භාරකරුවෝද විශාල වියදමක් දරති. සරසවි අධ්‍යාපනය දිග් ගැස්සෙන විට ආර්ථික අර්බුදයද තීව්‍ර වන්නේය.



අනෙක් අතට සමාජයට ද එහි ඵලවිපාක බලපාන්නේය. කිසියම් අධ්‍යයන වර්ෂයක් ප්‍රමාද වුවහොත් නවක සිසුන්ට ද බලා සිටීමට සිදුවේ. ඔවුන්ගේ අසහනය ද වර්ධනය වන බව විස්තර කළ යුත්තක් නොවන්නේ දැනට සරසවියේ සිටින සිසුන්ට ද එම අත්දැකීම තිබෙන බැවිනි. අවසාන වශයෙන් ජාතික සංවර්ධනයට ඇතිවන බලපෑම ද තේරුම් ගත යුතුය.

එබැවින් සරසවි සිසුන් පෞද්ගලික වශයෙන් ද සාමූහික වශයෙන් ද උනන්දු විය යුත්තේ සරසවියේ සාමය ආරක්ෂා කිරීමට හා එහි සාමකාමී අධ්‍යයන කටයුතු අවුලකින් තොරව පවත්වාගෙන යෑමට ය. විශාල ශිෂ්‍ය පිරිසක් රැස් වූ තැනක විවිධ මත ගැටුම් පැවතිය හැකි වුවද සියලු දෙනාම බුද්ධිමත් අය බැවින් ඒවා සමථයකට පත්කර ගැනීමේ හැකියාව පවතී.

එක් සිසුවෙකුගේ තත්පර කීපයක නොඉවසිල්ල හෝ නොමනා ක්‍රියාකාරීත්වයක් සරසවියේ මහා ප්‍රශ්නයක් බවට පත් වනුයේ සෙසු අය ද එසේ ක්‍රියා කළහොත් ය. සරසවියේ දී කවුරුත් අනුගමනය කළ යුත්තේ සාමය දිරිගන්වන සුළු ප්‍රතිපත්තියකි. එසේම ගැටුමට නොයෑමේ ප්‍රතිපත්තියකි. සැමවිටම කුමන හේතුවක් නිසාවත් ගැටුමට නොයෑම පිළිබඳ දැඩි අධිෂ්ඨානයක් බුද්ධිමත් සිසුන් තුළ පැවතිය යුතුය. ඉවසීම හා ගැටුමට නොයන සුළු චර්යාව කවුරුත් ප්‍රගුණ කළහොත් සරසවිය පමණක් නොව පෞද්ගලික ජීවිතය ද පවුලේ හා සමාජ ජීවිතය ද සාමකාමී වන්නේය. අනාගත ජීවිතය ද සාර්ථක වන්නේය. එබැවින් ශිෂ්‍ය නායකයන් ඇතුලු සියලු දෙනාම නිතර උත්සාහ කළ

යුත්තේ ගැටුම්කාරී පරිසරයක් ඇති නොවන පරිදි ඉවසීමෙන් ක්‍රියා කිරීමටය.

සරසවිය බුද්ධිමතුන්ගේ විද්‍යාර්ථීන්ගේ තෝතැන්නක් වන්නා සේම ඒ බව බාහිර සමාජයට ප්‍රකට විය යුතුය. එමගින් සරසවිය පිළිබඳ කීර්තිනාමය දියුණු තියුණු වන්නේය. සරසවියේ ප්‍රතිරූපය රැකීම හා කීර්තිනාමයට හානි නොවන පරදි හැසිරීමේ වගකීමක් සියලු සිසුන්ට ඇත්තේය. එම වගකීමෙන් කිසිවෙකුටත් බැහැර විය නොහැකිය. විශ්වවිද්‍යාලය වූ කලී ජීවිතයේ ප්‍රධානතම සන්ධිස්ථානය ය. යොවුන් වියේ සුන්දරතම කාල පරිච්ඡේදය ගත වන්නේ සරසවියේය. එම කාලපරිච්ඡේදය සතුටින් ගතකොට සාර්ථකව උපාධිය නිම කිරීමේ භාග්‍යය විදේශ රටවල බොහෝ සරසවි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ භුක්ති විඳිති. විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කර ගැනීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රචාරක පුස්තිකාලවල සරසවි ජීවිතයේ ආකර්ෂණීයභාවය හා සුන්දරත්වය උළුප්පා දක්වති. එම ලක්‍ෂණ සැබැවින්ම පවතී. ඒ සිසුන් සියලු දෙනාගේම සාමකාමී දායකත්වය පදනම් කොට ගෙනය. කිසිවෙක් සරසවියේ අවුල් ඇති කිරීමට කටයුතු නොකරති. ඒ සඳහා වැදගත් වන සප්‍රාණික යෙදුමක් ඇත්තේය. එනම් වරද පිළිගෙන සමාව ගැනීමය. අවංක හා විනය ගරුක ශිෂ්‍යයෝ වරද වහා පිළිගනිති. වහාම සමාව යදිති. ඒ අවංකභාවය හා නිහතහමානී ගුණාංගයට සුභවාදී ප්‍රතිචාර ලැබේ. ගැටුම් නිරායාසයෙන්ම සමනය වන්නේය.

එබැවින් සරසවියේ සුන්දරත්වය ආරක්‍ෂාකොට භුක්ති විඳීමට සිසුන් පුරුදු විය යුතුය. වරදක් වූ විට එය නොපිළිගන්නේ නම් ගැටුමකි. සමාව නොගන්නේ නම් ගැටුමකි. සමාව නොදෙන්නේ නම්



ගැටුමකි. එවැනි ගැටුමට තුඩු දෙන කරුණු වළක්වා සාමකාරක භාෂාවකට හුරු විය යුතුය. මෙරට සංස්කෘතිය වරද පිළිගැනීමට පසුබට වන්නා වූ ලක්‍ෂණයකින් යුක්තය. ඒ නිසා වරද පෙනි පෙනී ද තමන් නිවැරදිය යන ස්ථාවරයේ සිටිති. වරද ගෙන හැර දක්වා ඔප්පුකොට සාධක සාක්‍ෂි සහිතව පෙන්වා දුන්විට එය පිළිගැනීම වෙනුවට එරෙහිව "යුද්ධ" ප්‍රකාශ කරති. එය "මුග්ධ අභිමානය" ලෙස හැඳින්විය හැකිය. ඥානාන්විත අභිමානය වන්නේ වරද පිළිගෙන සමාව ගෙන සුහදතාව වර්ධනය කර ගැනීමෙන් ලබන අභිමානයයි. ස්වකීය ශබ්ද කෝෂය තුළ සමාව ගැනීම පිළිබඳ ප්‍රකාශ සප්‍රාණිකව පවත්වා ගත යුතුය. එවිට බොහෝ වියවුල් පහව යන්නේය.

සරසවියක ගැටුම් ඇතිවන මූලාශ්‍ර රාශියකි. පක්‍ෂ දේශපාලනය එක් මූලාශ්‍රයකි. ජ්‍යෙෂ්ඨ කනිෂ්ඨ භේදය තවත් මූලාශ්‍රයකි. තවත් එවැනි මූලාශ්‍රයන් ඇතත් මෙහි සඳහන් නොකරමි. දේශපාලනය කිරීම වරදක් නොවන්නේය. සරසවියක වැදගත් වන්නේ කාටත් දේශපාලනය පිළිබඳ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස හා අයිතිය භුක්ති විඳීමට ඉඩදීමය. විවිධ මතධාරීන් එක්ව සංවාද කළ යුතුය. එමගින් සරසවිය සංවාද මණ්ඩපයක් බවට පත් කළ යුතුය. එම සංවාදවලින් පසුව ප්‍රහාර එල්ල කිරීමට, පළිගැනීමට හෝ වෙනත් ප්‍රචණ්ඩකාරී ක්‍රියාවල යෙදීම වැනි සරසවියකට නොතරම් වන පහත් පෙළේ සාහසිකත්වයට නොපත් විය යුතුය. සහයෝගයෙන් දේශපාලනය කිරීමේ ගුණාංගය කවුරුත් වර්ධනය කර ගත යුතුය. විවිධ මතවාද ඉගෙනීමට, විවේචනය කිරීමට හා ඉවසීමට සරසවියේ දී උගෙන නොගන්නේ නම් තවත් තැනක් ඒ සඳහා නොලැබෙන්නේය.

සියලු දෙනාම සරසවියෙන් පිටව යා යුත්තේ විභාග සමත් කොට අභිමානයෙන් ය. එහිදී අතීතාවර්ජනය කිරීම අවශ්‍ය වේ. තමා සරසවි ජීවිතයෙන් ප්‍රයෝජන ගත්තේ ද, අන්‍යයන් හා සහයෝගයෙන් සිටියේ ද, සරසවියේ සාමයට හා ගෞරවයට කීර්තියට ප්‍රතිරූපයට හානිකර ලෙස බලපාන කිසිවක් නොකළේ ද, සරසවි දිවිය සුන්දර අත්දැකීමක් වූයේ ද ආදී වූ ප්‍රශ්න රාශියක් තමාගෙන් ම ඇසිය යුතුය. එහිදී පශ්චාත්තාපයක් ඇතිවීමට කරුණු නැත්නම් මහත් සන්තුෂ්ටියක් ඇතිවන්නේය.

සරසවිය තුළ සාමයෙන් හා සහයෝගයෙන් සිටීමේ ප්‍රතිඵල ජීවිතය පුරාම ලැබෙන්නේය. විවිධ පීඨවලට, අංශවලට, ක්ෂේත්‍රවලට අයත් සිසුන් සමඟ මිත්‍ර සම්බන්ධතා ඇතිකරගත් කල්හි දිගටම පවතී.

සරසවියෙන් බැහැරව රැකී රක්ෂාවලට ගිය පසුද එම සම්බන්ධතා විවිධ ආකාරයෙන් ප්‍රයෝජනවත් වන්නේය. කිසියම් ආයතනයකට ගිය විට සරසවි මිතුරෙක් ඉදිරියට පැමිණ "අපි එකට සිටියා මතක දැයි" අතීතය ආවර්ජනය කරමින් සම්බන්ධතා අලුත් කිරීම කොතරම් අගනා දෙයක් ද? ඔබට ඒ අවස්ථාව අනාගතයේ ලැබෙනුයේ අද කා සමගත් මිත්‍රශීලීව සිටිය හොත් පමණි. අර එන්නේ "අපට ගහපු එකෙක්" කියා අනාගතයේදී යම් ස්ථානයක දී කෙනෙකුට ඔබ හඳුන්වා දුන හොත් කොතරම් අපකීර්තියක් ද? සරසවියෙන් බැහැර ගිය පසුත් නොගැළවෙන අප කීර්තිමත් ලේබලයක් පවතින බව එයින් පැහැදිලි වේ. සරසවියෙන් බැහැර විය යුත්තේ කීර්තිමත් ලේබල් සහිතවය. එවිට ඒ ගැන රටේ තැන තැන සිටින මිතුරන් අනාගත්යේදීත් සුභවාදීව කතා කරනු ඇත. ඉතිරි කරගෙන යා යුත්තේ එවැනි චරිතයකි.



## 21 අපිරිසිදුකම හා අලංකාරය

සරසවිය ජීවන හැඩගැස්මක් ඇතිකර ගැනීමට ඉවහල් වන ස්ථානයකි. විවිධ අවස්ථාවන්ට මුහුණ දෙමින් මේ ජීවන හැඩ ගැස්ම ඇතිකර ගත හැකිය. ජීවන හැඩ ගැස්මේ ප්‍රධාන කරුණක් පිරිසිදුකමට අදාළ වන්නේය. තමා පිරිසිදුව සිටින්නා සේ සරසවියේ සියලු අංශ නේවාසිකාගාර ආදිය ද ඇතුළුව පිරිසිදුව අලංකාරව තබා ගැනීමට තමාගේ පැත්තෙන් දිය යුතු දායකත්වය ලබා දිය යුතුය. සරසවියේ විවිධ ස්ථානවල සිට ආහාර ගන්නා ඇතැම් සිසුහු ශේෂවන කොළ පොලිතීන් ආදී අපද්‍රව්‍ය එම ස්ථානවල හෝ පඳුරක් යටට හෝ දමා තිබෙනු දැකිය හැකිය. තමා ආහාර ගත් ස්ථානයේම අපද්‍රව්‍ය ඉතිරිකොට යෑම උගත් ශිෂ්‍ය ප්‍රජාවකට තරම් නොවන ක්‍රියාවකි. දිනක් සරසවියට බැහැරින් ආ කෙනෙක් කසල බඳුන්වලට නොදමා තැන තැන කසළ දමා තිබෙන්නේ මන්දැයි විමසූහ. ඊට දීමට අපට පිළිතුරක් නොවීය.

එසේම සරසවියේ ඇතැම් ප්‍රචාරක පෝස්ටර් ද අලංකාරයට හානිකර ලෙස ඇලවීමේ පුරුද්දක් පවතී. සරසවි තාප්ප, බිත්ති, ජනෙල්, දොරවල්, ගස් හා ලයිට් කණු ආදියේ පෝස්ටර් ඇලවීම හේතුකොට ගෙන ඒවා අපිරිසිදු වේ. අපේ රටේ පෝස්ටර් ගසන ආකාරය අනුව අපිරිසිදුකම වැඩිය. ඒ පාප්ප බාල්දි පිටින් පෝස්ටරය ඇලවීමට පෙරත් ඇලවීමෙන් පසුවත් ආලේප කරන බැවිනි. විශාල වියදමක් දරා වර්ණාලේප කළ බිත්තිවල පවා කිසිදු තැකීමකින් තොරව දැන්වීම්, පෝස්ටර් ආදිය අලවන අය සිටිති. සරසවිය අපේය. යන හැඟීම ඇත්නම් එය එසේ අපිරිසිදු නොකරනු ඇත. සියලු සිසුන් තම දේශන ශාලාද, ආපන ශාලා ද, නේවාසිකාගාර ද, සරසවියේ

සෙසු ස්ථාන ද ගොඩනැගිලි ද පෝස්ටර් මගින් අපිරිසිදු නොකිරීමට වග බලා ගැනීම යහපත් චර්යාවකි. එමගින් සරසවි සිසුන්ගේ විනය ගරුකභාවය පිළිබිඹු වන්නේය. විනය ගරුක වීමට උගෙනීම ජීවන පාඩමකි.

## 22 අලාභ නොකිරීම

සරසවි දේපළට අලාභ හානි නොවන පරිදි හැසිරීම ද විනයේ ම කොටසකි. සරසවියට ගොඩනැගිලි, උපකරණ, තාක්ෂණික මෙවලම් හා විවිධ වෙනත් භාණ්ඩ ආදිය ලබා ගනුයේ විශාල ධනස්කන්ධයක් වැය කිරීමෙන්ය. රටේ තත්ත්වය අනුව දීර්ඝ කාලයක් තිස්සේ කරනු ලබන කැප කිරීම මත යම් දියුණුවක් ලබා ශිෂ්‍යයන්ගේ පහසුව ඇතිකරනු ලැබ තිබේ. මේසයක් හෝ පුටුව අබලන් කිරීම ඉතා පහසුය. එහෙත් ඒවා මිල දී ගැනීම ඉතාම දුෂ්කර ක්‍රියාවකි. මුදල් සපයා ගැනීම පමණක් නොව නීත්‍යානුකූලව මිල දී ගැනීම් වුවද මහත් පරිශ්‍රමයකින් කළ යුතු ඒවාය. එබැවින් සියලු සිසුන් සරසවියේ දේපළ පරිහරණය කළ යුත්තේ වගකීමකින් යුක්තවය. ඒවායේ මිල ගණන් පිළිබඳව ද කල්පනා කළ යුතුය. භාණ්ඩ පමණක් නොව ජලය හා විදුලිය බලය ද විශාල ධනයක් වැය කොට ලබා දෙන්නකි. ඒ නිසා ඒවා පරිහරණයේ දී අරපරිස්සම ප්‍රධාන ප්‍රතිපත්තිය කර ගත යුතුය. නාස්තියේ පිරිවැය රටට බරක් වන්නේය.

පුස්තකාල පරිහරණය ද දූන් දූන් අශෝභන හා අසාමාන්‍ය වී තිබෙන බවක් පෙනේ. ඇතැම් පොත්පත්වලින් මැද පිටු ඉරා ගෙන ගොස් තිබේ. පොත්පත්වලට අනවශ්‍ය ලෙස හානිකර තිබේ. මෙහිදී



උභතෝකෝටික ප්‍රශ්නයක් මතුවන්නේය. එනම් නවීන ෆොටෝ කොපි පහසුකම් ආදිය නොමැති සමයේ එනම් අවශ්‍ය සටහන් ආදිය අතින්ම ලියා ගත යුතුව පැවති සමයේ පොත් පත් ආරක්ෂා වීමත් කොපි කිරීමේ සියලු නවීන පහසුකම් පවතින සමයක පොත්පත්වල කොළ ඉරාගෙන යෑමත්ය. මෙවැනි දෑ විය යුතුව පැවතියේ කොපි කිරීමේ තාක්ෂණය නොමැති සමයේය. එකල පොත් පත් ආරක්ෂා වීමත් එකී තාක්ෂණික පහසුකම් සුලභ සමයක තර්ජනයක් එල්ලවීමත් අනාරවණය කරන්නේ අසුභ ලක්ෂණයකි. එනම් පොත්පත් පරිහරණය කරන ඇතැම් සිසුන්ගේ විනයේ පරිහානියයි. ආත්මාර්ථකාමී ලක්ෂණයේ බලපැවත්මය. අනුන් ගැන තැකීමක්, අනාගත පරම්පරා ගැන තැකීමක්, පොදු දේපොළ පිළබඳ තැකීමක් නොකරන්නෝ පොත්පත්වල කොළ ඉරාගෙන යති. සරසවි සිසුන් ඒ තත්ත්වයට පත් නොවිය යුතුය. යම් පොතක එවැනි ප්‍රශ්නයක් ඇත්නම් එය සරසවි ප්‍රජාවටම කැළලකි. අපකීර්තියකි. සරසවි පුස්තකාලය සරසවියේ හදවත වන අතර එම හදවත පළුදු කිරීම මහා විනාශයක් ය. අනාගත පරපුර සඳහා එය ආරක්ෂා කර තැබීමේ වගකීමක් සියලු සිසුනට තිබේ. කලින් සිටි සිසුන් ආරක්ෂා කළ නිසා වර්තමාන සිසුහු හොඳින් පරිහරණය කරති. ඒ අවස්ථාව ඊළඟ පරපුරට අහිමි නොකළ යුතුය.

## 23 ස්වභාෂාව හා සන්නිවේදන කුසලතාව

සරසවි ශිෂ්‍යයා බුද්ධිමතෙකු වන්නා සේම එම බුද්ධිය සමාජයට ප්‍රදානය කිරීමේ හැකියාවකින් ද පසුවීම අවශ්‍යම දෙයකි. පසේ බුදුවරුන් වැනි උපාධිධාරීන්ගෙන් සමාජ මෙහෙවරක් ඇති නොවන්නේ ය. සන්නිවේදනය පැත්තෙන් බලන

කල්හි අපේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හදාගත යුතු අඩුපාඩු රාශියක් ඇත්තේය. එසේම දියුණු කරගත යුතු කුසලතා ද රාශියකි. ඉන් පළමු වැන්න සන්නිවේදන මාධ්‍ය ය. සිංහල සිසුන් සිංහල භාෂාවෙන් ද දෙමළ සිසුන් දෙමළ භාෂාවෙන් ද සන්නිවේදනය කිරීමේ කුසලතාව වර්ධනය කරගත යුතුය. ස්වකීය මවු බස ආවාට ගියාට සැලකිල්ලට ගන්නා බැවින් මවු බසවත් හරියාකාරව හැසිරවිය නොහැකි ශිෂ්‍ය ශිෂ්‍යාවෝ බොහෝ දෙනෙකි. එය සරසවි සිසුන්ට තරම් නොවන ලක්ෂණයකි. සිංහල සිසුන් සිංහලය හරියට කථා කිරීමට මෙන්ම ලිවීමට දන්නේ ද යන්න ප්‍රශ්නයකි. දෙමළ සිසුන් එතරම් සබ්‍යාවක් නොමැති බැවින් ඔවුන්ගේ දුර්වලතා හෙළිදරව් නොවේ.

භාෂාව හදාරණ සිසුන්ට හැර අන් කිසිදු ශිෂ්‍යයෙකුට විශ්වවිද්‍යාලයේ දී සිංහල භාෂාව උගන්වනු නොලැබේ. ඔවුන් උසස් පෙළ දක්වා උගෙන ගෙන ආ සිංහලයෙන් සරසවියේදී අධ්‍යාපනය ලැබීය යුතුය. එහෙත් පාසල් අධ්‍යාපනයේ දී අනෙකුත් විෂය ධාරාවන්ට තබා කලා විෂය ධාරාවලට අදාළවවත් සිංහල භාෂා ප්‍රවීණතාව දියුණු නොකෙරේ. එබැවින් සරසවියට පැමිණෙන වෛද්‍ය ශිෂ්‍යයාගේ පටන් මානව ශාස්ත්‍ර, සමාජ ශාස්ත්‍ර හදාරන ශිෂ්‍යයා දක්වා වූ විශාල පරාසයක් තුළ මවුබස හොඳින් නොදැනීමේ අර්බුදය පවතී. එය හඳුනා ගත හැකි වන්නේ විවිධ අවශ්‍යතා සඳහා ඔවුන් ලියන කියන දෑ වලින් හා විවිධ අවස්ථාවන්හී දී සිංහල භාෂාව හසුරවන ආකාරයෙන් ය.

නිදසුනක් ලෙස සරසවි භූමියේ විවිධ ස්ථානවල අලවා ඇති පෝස්ටර් දැක්විය හැකිය. මෙවැනි පෝස්ටර් දේශපාලන, අවමංගල, අධ්‍යාපනික



හා වාණිජ ආදී ක්ෂේත්‍ර ගණනාවකට අයත්ය. ඒවායේ ඇතැම්විට නිවැරදි සිංහල භාෂාවක් භාවිත කොට ඇති බව පෙනී යන්නේ නමුත් බොහෝ විට දක්නට ලැබෙනුයේ දුර්වල භාෂා හරඹයකි. අක්ෂර වින්‍යාසය කොතෙක් වරද්දන්නේ දැයි කිවහොත් 'කළ' හා 'කල' යන්නෙහි වෙනස නොදැන 'කළ' යෙදියයුතු තැනට 'කල' කියා ලියන ලද දැන්වීම් නිතර දක්නට ලැබේ. එසේම පද ගැළපීම, වාක්‍ය රටාව අතිශයින්ම ව්‍යාකූලය. සමහර අවමංගල දැන්වීම් රැගත් පෝස්ටරයක් තේරුම් ගැනීම සඳහා දෙතුන් වරක් කියවා බැලිය යුතුය. මිය ගොස් ඇත්තේ ශිෂ්‍යයෙකු ද එසේ නැත්නම් ශිෂ්‍යයෙකුගේ ඥාතියෙකු ද යන්න අපහැදිලි බැවිනි. මේ නිසා විශ්වවිද්‍යාලයට එන අමුත්තන් තුළ සිසුන් පිළිබඳව වැරදි ආකල්පයක් ගොඩ නැගෙන්නේය. ප්‍රසිද්ධ ස්ථානවල අලවා ඇති පෝස්ටර් කියවන අමුත්තෝ මේ තරමට ම සිංහල දුර්වල ද කියා උපහාසාත්මක සිනහ පහළ කරති. මෙම ලිපිය ලියන මොහොතේ සුමංගල ගොඩනැගිල්ල ඉදිරිපස විශාල පෝස්ටරයක "අධ්‍යයන" වචනය ලියා තිබුණේ "අධ්‍යණ" කියාය. එම පෝස්ටරය අදාළ ප්‍රවෘත්තිය සමඟ සරසවියේ කිහිපපොළකම අලවා තිබුණි. සරසවියට පැමිණෙනුයේ උසස් අධ්‍යාපනය සඳහාය. එය ලබන මාධ්‍යය සිංහල වුවද ඉංග්‍රීසි වුවද කම් නැත. දැන්වීම සඳහා භාවිතා කරන මාධ්‍යය නිවැරදි විය යුතුය. 'අධ්‍යයන' පදයවත් හරියට නොලියන තැනක ගණ දෙවියන් හෝ සරස්වතී රඳනු ඇද්දැයි බලවත් සැකයකි.

පැරණි සමාජයේ බොහෝ දෙනෙක් බහුශ්‍රැත වූහ. අකුරු නොදත් සමයේ පඬිවරුන් සිටියේ අතලොස්සකි. ඔවුහු ද ඔවුන්ගෙන් ශාස්ත්‍ර හැදෑරූවෝ

ද බහුශ්‍රැත වූහ. බොහෝ ඇසූ පිරූ තැන් ඇති අය වූහ. අද ඇසූ සිංහලයවත් හරියට ලිවීමට නොහැකි තත්ත්වයක් තුළ නෑසූ සිංහලයක් ලියන්නේ කෙසේද? අද බහුශ්‍රැත වීම වුවද ප්‍රමාණවකත් නොවේ. බහු පඨිත ද විය යුතුය. එනම් බොහෝ සෙයින් පඨනය කළා වූ හෙවත් කියවූ කෙනෙක් වීමේ අවශ්‍යතාවයි. භාෂාව පෝෂණය වන්නේද ඇද ඇරෙන්නේ ද එමගින්ය.

සිසුන් විසින් ලියනු ලබන ලිපි ලේඛනවල භාෂාවද ලේඛන රටාවද වැරදි සහගත බවට ආචාර්යවරු ද පරිපාලන නිලධාරිහු ද නිතර චෝදනා කරති. නිවැරදි කිරීමට අවස්ථාවක් ලබා දුන්න ද වරද නොහඳුනන බැවින් නිවැරදි කිරීමට අපොහොසත්ව අසරණ වෙති. මෙය හොඳ ලක්ෂණයක් නොවන්නේය. එබැවින් විශ්වවිද්‍යාලයේ සෑම ශිෂ්‍ය ශිෂ්‍යාවක්ම තමා හදාරන පාඨමාලා කුමක් වුවද බහුතර ජනතාවගේ ව්‍යවහාරික භාෂාව වන සිංහලය හැකි උපරිම මට්ටමෙන් නිවැරදිව හැසිරවීමට උගත යුතුය. දූන් දූන් භාෂා දුර්වලතාවෙන් පෙළෙන අය පරිපාලන ක්ෂේත්‍රවල ද බහුල වෙමින් පවතිනුයේ සරසවියේ දී භාෂා ගැටලුව නොවිසඳෙන බැවිනි. ඉතා වැදගත් සභාවල සභා වාර්තා ආදියේ භාෂා දෝෂ බහුලව දක්නට ලැබේ. ඒවා ලියනු ලබන්නේ උසස් තනතුරු දරන අය විසිනි. ලියා ඇති වැරදි බස තනතුරට තරම් නොවන්නේය. වරදක් පෙන්වන විට පිළිතුරු වනුයේ "අප සිංහල කළ අය නොවේ"ය යන්නය. එය පිළිතුරක් නොවන්නේ ය. සිංහල දත යුත්තේ සිංහල විෂයක් ලෙස උගත් අය පමණක් නොවේ. උගත් සියලු දෙනාම හොඳ සිංහල දැනගත යුතුය. භාවිත කළ යුතුය.



භාෂාව නිවැරදි වන්නා සේම සන්නිවේදනය ආචාර සමාචාරශීලී ද විය යුතුය. එය විශ්වවිද්‍යාලයේදී උගෙන ගත යුතු වැදගත් ගුණාංගයකි. ආචාර සමාචාරශීලීව ලේඛනයක් ලියන්නේ හෝ දේශනයක් ඉදිරිපත් කරන්නේ හෝ අන්තර්පුද්ගල සම්බන්ධතා පවත්වන්නේ හෝ කෙසේද කියා ඉගෙනීමේ අවශ්‍යතාවක් පවතී. ආචාර සමාචාරශීලී ලේඛන සම්ප්‍රදායන් මෙන් ම කථන සම්ප්‍රදායන් ද තිබේ. සුහවාදී මානව සම්බන්ධතා සඳහා එම සම්ප්‍රදායන් වැදගත් වන්නේය. සමහර සිසුන්ගේ ආමන්ත්‍රණ අසා ආචාර්යවරු කලකිරීමට පත්වෙති. ඒ තමන්ගේ හෝ තම සරසවියේ ගෞරවනීය ආචාර්යවරයෙකුට හෝ ආචාර්යවරියකට නොගැළපෙන අයුරින් ආමන්ත්‍රණය කිරීම නිසාය. ගරු සරු දැක්විය යුත්තේ තමන්ට උගන්වන ගුරුවරයාට පමණක් නොවේ. සියලු ආචාර්යවරු ස්වකීය සරසවිය නියෝජනය කරන්නාහ. එබැවින් ඔවුන් සියලු දෙනා විෂයෙහි ආචාර සමාචාරශීලි වීම පෙරදිග සම්ප්‍රදායකි. ආචාර සමාචාරශීලී වීමට අතිරේක පිරිවැයක් හෝ වෙහෙසක් හෝ වෙනත් කැප කිරීමක් නැත්තේය. අවශ්‍යවන්නේ ශික්ෂිතභාවය හෙවත් හික්මීම හා හොඳ හැදියාවය. ශික්ෂණය හා හොඳ ගති පැවතුම් නිරන්තරයෙන්ම සිතට ආනන්දයක් ම ගෙන දෙන්නේය. පසුතැවිල්ලක් ගෙන නොදෙන්නේය. මිනිසුන් අතර හෘදයාංගම සම්බන්ධතා තහවුරු කරයි. හොඳ ප්‍රතිරූප වර්ධනය කර, කීර්තිය පතුරුවාල යි. නිසි අය විෂයෙහි නිසි ගෞරව දැක්වීමෙන් අනර්ථයක් ඇති නොවේ. එහෙත් ඇතැම් සිසුන්ට ඒ පිළිබඳ අවබෝධයක් නැත. කිසිදු ගරුසරුවක් නැතිව ආචාර්යවරුන්ට හා ආචාර්යවරියන්ට කථා කරති. වාද විවාද කරති. සමහර උණුසුම් අවස්ථාවල දී තර්ජන ගර්ජන සහිතව බස

හසුරුවති. අනවශ්‍ය වචන භාවිත කරති. කෙනෙකුගේ යථා තත්ත්වය අනාවරණය වන්නේ අභියෝග සම්පන්න හෝ ගැටුම්කාරී අවස්ථාවන්හීදී ය. එවැනි අවස්ථාවකදී ආචාර සමාචාරශීලීව ගැටලුව විසඳා ගැනීමට අපොහොසත් වන්නේ නම් එය දුර්වලතාවකි.

ප්‍රසිද්ද දැන්වීම් හා පෝස්ටර්වල ද විශ්වවිද්‍යාලයට නොගැළපෙන ලක්ෂණ තිබේ. සමහර පෝස්ටර්වල ඉල්ලීම් ආදිය ඉදිරිපත් කොට ඇත්තේ ඉතා පහත් විධානාර්තවාචී පද ආශ්‍රයෙන්ය. ''දියව්, බලව්, නිදහස් කරව්, විසඳවු, ගෙදරයනු, අකුළා ගනිවු'' එවැනි පද කීපයකි. මේ පද අභිමානාර්ථවාචීවද භාවිත කළ හැකිය. ''එහෙත් වඩාත් ග්‍රාම්‍ය වූ හැඟීමක් ඒ පදවලින් ප්‍රකට වන්නේ නම් යෝග්‍ය නොවේ. සරසවියේ පෝස්ටර්වලින් අඩකටත් වැඩි සංඛ්‍යාවක් ඉලක්කකොට ඇත්තේ උපකුලපතිතුමා ප්‍රධාන පරිපාලන අංශයයි. ඉතා සුහදශීලීව මුහුණට මුහුණ සම්බන්ධතා පවත්වන අතර ඒ අයටම ප්‍රතිවිරෝධය පාන පෝස්ටර් ආදිය සකස් කරන්නේ කෙසේද යන්න ගැටලුවකි. ''දියව්, බලව්, ගනිව් ආදි පදවලින් යුත් වාක්‍ය කණ්ඩ මගින් තමන් මේ ආමන්ත්‍රණය කරන්නේ කාටද යන්න හදවතින්ම කල්පනා කළ මැනවි. සරසවි සිසුන් වෙනුවෙන්ම කැපවී ක්‍රියා කරන අධ්‍යයන හා අනධ්‍යයන අංශවලට හෝ ඒවායේ ප්‍රධානීන්ට එසේ විධාන කෙරේ. පෝස්ටරයක් මගින් වුවත් ඉල්ලීමක් වඩා ආචාර සමාචාරශීලීව ඉල්ලීමට නොහැකි මන්ද''. පාලක කාරක කාරකාදීහු සතුරෝ නොවන්නාහ. එදිරිවාදීහු නොවෙත්. ශිෂ්‍ය අභිවෘද්ධිය වෙනුවෙන් ඔවුහු කැපවී සිටිති. එසේ ක්‍රියාකරන පිරිසකට පෝස්ටර් මගින් සන්නිවේදනය කිරීමට



අවශ්‍ය දේ මීට වඩා ආචාරශීලීව ඉදිරිපත් කළ නොහැක්කේ මන්ද?

එසේම එවැනි පහත් ගණයේ විධානාර්ථවාචී පද සහිත ඉල්ලීම් ගැන පෝස්ටර්වලින් කියවා අනතුරුව ප්‍රතිචාර දක්වනු ඇද්ද යන්න ද ගැටලුවකි. පෝස්ටරය කියවන විටම අදාළ නිලධාරියාට කේන්ති යෑමට පුළුවන. අනවශ්‍ය වෛරයක් ජනිත වීමට ද ඉඩ තිබේ. එවැනි ද්වේශයක් ප්‍රශ්න විසඳීමට නොව ප්‍රශ්ණ දිග් ගැස්සීමට හේතු වන්නේය.

## 24 කියවීමට ලිපි සංග්‍රහයක්

පලිහපිටිය, රංජිත් අමරකීර්ති, ප්‍රණීත් අභයසුන්දර. සනත් ආනන්ද වීරවර්ධන, අමරසේකර හෙට්ටිආරච්චි (සංස්කාරකවරු) 1982. සමාචාර. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ප්‍රතිභා පදනම, කොළඹ : ප්‍රදීප ප්‍රකාශකයෝ.

**පහත සඳහන් ලිපි එහි ඇතුළත්ය**

1. අදිකාරම්, ඊ. ඩබ්ලිව් (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති - 1982) පිරිපුන් අධ්‍යාපනය
2. කාන්ගහආරච්චි, ටී. බී. (ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කුලපති - 1982) විශ්වවිද්‍යාලය හා භික්ෂුව
3. අකුරැටියේ නාහිමි, අමරවංශ. (විද්‍යොදය පරිවේණාධිපති රාජකීය පණ්ඩිත -1982) විශ්වවිද්‍යාලය හා භික්ෂුව.

4. ආරියරත්න, ඒ. ටී. (සර්වෝදය සභාපති) සංවර්ධනය හා විශ්වවිද්‍යාලයීය ශිෂ්‍යයා.
5. සරච්චන්ද්‍ර, එදිරිවීර. (මහාචාර්ය) ඔබ විශ්වවිද්‍යාලකට පිවිස ඇත.
6. ගමගේ, ධර්මසිරි. ඔබේ ස්වර්ග රාජ්‍යයට මම පැමිණියෙමි.
7. රත්නපාල,නන්දසේන. (මහාචාර්ය) සරසවිය හුදෙකළා බිමක් ද?
8. සිල්වා, ද. ටියුලි. (මහාචාර්ය) සරසවි විනය.
9. ආරියදාස, එඩ්වින්. නවක වදයේ නව මුහුණුවර.
10. අබේසේකර, ආරියවංශ, සරසවියේ සිට.
11. රණසිංහ, පියදාස. (ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ සහකාර පුස්තකාලයාධිකාරි - 1982 ) අතීතාවලෝකනය.
12. ජයතිලක, කේ. විශ්ව විද්‍යාලය හා තරුණ නායකත්වය.
13. කෝදාගොඩ, නන්දදාස. (මහාචාර්ය) මඟ හොඳට තිබේ නම්
14. දිසානායක, ජේ. බී. (මහාචාර්ය) සරසවි බස් වහර
15. මේදිස්, පියසෝම. (ශ්‍රී ලංකා පදනම් ආයතනයේ පාඨමාලා අධ්‍යක්ෂ - 1982 ශාස්ත්‍රපති) සරසවියෙන් ප්‍රජාවට.



## 25 කර්තෘගේ ශාස්ත්‍රීය ලිපි

***Research studies presented at international conferences/seminars and published as full chapters and papers in books, journals, conference volumes and collection of research papers. (Published in English, Vietnamese and Japanese Languages).***

1. *Hitotsubashi University students' perception of social roles of males and female. ( Written and published in Japanese language) Bridges Journal. Vol.9, Summer Edition 1998. Hitotsubashi University, Tokyo. Japan.*
2. *Socio-economic Policies, Development and Crime in Post Independent Sri Lanka. 1999. Hitotsubashi University, Tokyo. Japan*
3. *Information society. Book review paper was presented at the Hitotsubasi University, 1999 Tokyo, Japan.)*
4. *Social change and crime in Sri Lanka. Faculty of Social Sciences. Hitotsubashi University, 1999, Tokyo. Japan.*

*5. Theories of the impacts of modernization on crime. Kokugakuin University, 2002. Tokyo. Japan.*

*6. An outline for a research study on crimes in contemporary Sri Lankan society. Faculty of Social Sciences, Hitotsubashi University. 2002, Tokyo, Japan.*

*7. Social change and crime in modern Sri Lanka; the political aspect of underworld criminal gangs. Hitotsubashi University 2003. Tokyo Japan.*

*8. Transformation of organized crime by gangs: the problem of "Army deserters".Kokugakuin University, 2003. Tokyo. Japan.*

*9. The impact of army deserters on organized crime in Sri Lanka. University of Sri Jayewardenepura. 2005. Sri Lanka.*

*10. Towards a sociolinguistic theory of crime. University of Kelaniya. 2008. Sri Lanka*

*11. Sexual crimes against women: a study of criminal justice systems of Sri Lanka. University of Sabaragamuwa. 2010. Sri Lanka.*

*12. Role of Buddhism in the adaptation to widowhood caused by the ethnic conflict in Sri Lanka. Mahachulalonkornrajavidyalaya University. 2011. Bangkok, Thailand.*

*13. Waste disposal and health; with reference to incidents of cancer in the neighborhood of the National Cancer Institute, Maharagama.*



*University of Sri Jayewardenepura. 2011. Sri Lanka.*

*14. Buddhist sociological theory of basic human needs for developing new models of social work practice. University of Sri Jayewardenepura. 2011. Sri Lanka.*

*15. Buddhist psychological theory of basic human needs for developing new models of social work practice. Gautam Buddha University. 2012. Greater Noida. India.*

*16. A study on the role of laugh in social interaction in modern society, University of Sri Jayewardenepura. 2013. Sri Lanka*

*17. Environmental politics and land encroachment in post war Sri Lanka. University of Allahabad. 2012. Allahabad, India.*

*18. Sustainable development and environmental education. A research paper for the special magazine published for Rri+20 Summit in Rio de Janairo, Brazil, UN conference for sustainable development in June 2012. Ministry of Environment. Sri Lanka.*

*19. A study on the colonial roots of ethnic problem and the consequent war in Sri Lanka. University of Sri Jayewardenepura. 2013. Sri Lanka*

*20. Social impacts of the development of public roads and transportation in Sri Lanka. University of Management Sciences.2013. Lahore. Pakistan*

21. *A study on the social aspect of changing patterns of sleep in rural society. University of Sri Jayewardenepura. 2013 Sri Lanka.*
22. *A study on the prerequisites of peace building in post conflict Sri Lanka. University of Allahabad, 2014- Allahabad, India.*
23. *A study of the role of Buddhist Dhamma school education in dealing with the issues of achieving UN Millennium Development Goals (MDG) in Sri Lanka. Vietnam Buddhist University. 2014. Hanoi, Vietnam.*
24. *Social work research needs in Sri Lanka. National institute of Social Development. 2014. Sri Lanka.*
25. *Buddhist organizational contribution to the achievement of UN Millennium Development Goals (MDG); a study on the child development programs conducted by the All Ceylon Buddhist Congress in Sri Lanka. Vietnam Buddhist University. 2014. Hanoi, Vietnam.*
26. *A Study on the role performed by Buddhist temples in response to environmental degradation in Sri Lanka. Mahachulalonkornrajavidyalaya University, 2015. Bangkok, Thailand.*
27. *A study on the Buddhist strategies adopted for coping with stress. University of Sri Jayewardenepura. 2015. Sri Lanka.*
28. *Buddhism in Mekong region; a sociological study on the reciprocal religious relationship between Myanmar and Sri Lanka in the 11th and 12th centuries. 2015. Paper was published by the conference in 2015. Buddhist research Institute and Ho Chi Min University of Social Sciences and Humanities. Vietnam.*



29. *An inquiry into the consciousness required to support one's parents and the concerns shown towards the super aged and aging societies; An analytical study of the responses received from the University students in Japan and Sri Lanka. Catholic University of America. 2015. Washington, the USA. The paper was published in Japanese language in 2014 by Thokai University of Japan, Tokyo Japan.*
30. *A Study on the social impacts of changing family structure on the aging people. Bulletin of the School of Health Sciences, Thokai University publication. 2015. Tokyo Japan.*
31. *A Study on the Impacts of Religious Response to the Repercussions of War: Revival of Buddhist Culture and Religiosity in Contemporary Sri Lanka. Mahachulalonkornrajavidyalaya University, 2016. Nan. Thailand.*
32. *A study on the Social Generation of Waste in Sri Lanka. Leiden University 2016. Leiden, The Netherlands.*
33. *The role of adult children in the care of their elderly parents. Comparison of care consciousness of university students towards*

*their elderly parents in Sri Lanka and Japan. Rishso University. 2016. Tokyo, Japan.*

34. *Crime against women and children in contemporary Sri Lanka. International Congress of Psychology, Invited Speech, ICP.2016. Yokohama, Japan. The paper was published by the Tokai University. 2016. Tokyo. Japan.*
35. *Post war challenges of conflict resolution in Sri Lanka: A study on the importance of educating the Northern Tamil young generation about the Sinhalese society in the Southern parts of the country. Fatima Jinnah Women University, 2016. Rawalpindi, Pakistan.*
36. *A study on the social impacts of commodification of Buddhist religious properties in contemporary Sri Lanka. University of Copenhagen. 2016 Copenhagen, Denmark.*
37. *A study on the commodification of religious rituals and social reproduction in contemporary Sri Lanka. Johannes Kepler University., 2017, Linz. Austria.*
38. *A Study on the social linguistic functions of the language of Pali in the Theravada Buddhism. 2017. Sri Lanka.*